**වර්ෂ 2022 ජුනි මස 10 වන දින පෙ.ව. 09.30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-**

- **ගරු සභාපතිතුමා අත්‍යාවශ්‍ය කරුනක් හේතුවෙන් සහභාගි වීමට සුළු වේලාවක් ප්‍රමාද වන හෙයින් ගරු උප සභාපතිතුමා මූලසුන ගැනීම** :- ගරුඋප සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාවේ පෙ.ව. 9.30 වන විට සණ පූර්ණය සභාවේ රැදි නොමැති හෙයින් විසින් මහ සභාවේ කටයුතු පෙ.ව. 09.40 දක්වා කල්තැබීමට ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් යෝජනා කල අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.
- පැමිණීම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා සහ ගරු මන්ත්‍රීතුමියන්ලා සහභාගි විය.

| අනු.අ | තනතුර | පක්ෂය | නම | පැමිණීම |
|---|---|---|---|---|
| 1. | ගරු සභාපති | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමරත්න මල්කැකුල මහතා | පෙ.ව. 08.15 |
| 2. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමා ගම්ලත් මිය | පෙ.ව. 08.15 |
| 3. | ගරු ප්‍රාසම | එ.ජා.ප | ඉන්ද්‍රානි වික්‍රමසිංහ මිය | පෙ.ව. 08.20 |
| 4. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා | පෙ.ව. 08.20 |
| 5. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර් .සෝමරත්න මහතා | පෙ.ව. 09.02 |
| 6. | ගරු ප්‍රාසම | එ.ජා.ප | චන්ද්‍රලතා බණ්ඩාර මිය | පෙ.ව. 09.00 |
| 7. | ගරු ප්‍රාසම | එ.ජා.ප | නයනා ජීවනි අතුකෝරල මිය | පෙ.ව. 09.10 |
| 8. | ගරු ප්‍රාසම | ශ්‍රී .ල.පො.පෙ | ජී.එම්. ජයරත්න | පෙ.ව. 09.17 |
| 9. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රුවන් අශෝක පතිරණ මහතා | පෙ.ව. 09.17 |
| 10. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.පී.තරංග නිල්මිණි මහතා | පෙ.ව. 09.20 |
| 11. | ගරු ප්‍රාසම | ජ.වි.පෙ | ජී.ඒ.ජයසිංහ මහතා | පෙ.ව. 09.25 |
| 12. | ගරු උපසභාපති | ශ්‍රී.ල.පො.පෙ | ඒ.ජේ.අනිල් ලියනගේ මහතා | පෙ.ව. 09.30 |
| 13. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මංගල කිත්සිරි ඩයස් මහතා | පෙ.ව. 09.31 |
| 14. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කැළුම් ශ්‍රී ධර්මදාස මහතා | පෙ.ව. 09.37 |
| 15. | ගරුප්‍රාසම | එ.ජා.ප. | ජී.ට්.ඒ. රනිල් එදිරිසිංහ | පෙ.ව. 09.38 |
| 16. | ගරු ප්‍රාසම | ජ.වි.පෙ | එම්.ඩබ්.විකසිත පුෂ්පසූරිය මහතා | පෙ.ව. 09.38 |
| 17. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | ප්‍රභාත් ජයසූරිය | පෙ.ව. 09.40 |
| 18. | ගරුප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | චන්දිම යුරේශ් පතිරණ මයා | පෙ.ව. 09.40 |
| 19. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.කේ. විජේසිරි මහතා | පෙ.ව. 09.40 |
| 20. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | ඩබ්.කේ.තිලකාවති මිය | පෙ.ව. 09.40 |
| 21. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.කේ. දයා කස්තුරි මිය | පෙ.ව. 09.45 |
| 22. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.ඒ.අසංක දිල්ෂාන් මහතා | පෙ.ව. 08.50 |
| 23. | ගරු ප්‍රාසම | එ.ජා.ප | මුදිතා ශ්‍රීමතී සෝමරත්න මිය | පෙ.ව. 09.55 |
| 24. | ගරු ප්‍රාසම | ශ්‍රී .ල.පො.පෙ | ජීවන් රණතුංගමහතා | පෙ.ව. 10.10 |
| 25. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.ඩබ්.එස්.සම්පත් බොතේජු මහතා | පෙ.ව. 10.11 |
| 26. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එම්.ජී.ධනංජය වීරසේකර මහතා | පෙ.ව. 10.12 |
| 27. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩබ්.එම්.මදුෂාණි වීරසිංහ මිය | පෙ.ව. 10.12 |
| 28. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.ඩබ්.ජනක විමලසිරි මහතා | පෙ.ව. 10.15 |
| 29. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර්.ඩිලාන් දර්ශන රණසිංහ මහතා | පෙ.ව. 10.20 |
| 30. | ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | එස්.ඩබ්.රන්ජිත් මෙන්ඩිස් මහතා | පෙ.ව. 10.22 |
| 31. | ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | රොෂාන් දේශප්‍රිය මහතා | පෙ.ව. 10.22 |
| 32. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩී.එම්. ශානක දර්ශන මහතා | පෙ.ව. 10.22 |
| 33. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා | පෙ.ව. 10.24 |
| 34. | ගරු ප්‍රාසම | එ.ජා.ප | අයි.කේ.කුලරත්න මහතා | පෙ.ව. 10.45 |
| 35. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | අයි.කේ.රංජන් ප්‍රදීප් මහතා | පෙ.ව. 10.45 |
| 36. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.ඩබ්.ජයලත් මහතා | පෙ.ව. 10.50 |
| 37. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | කේ.එල්.එම්.ඩී.කරඳන මිය | පෙ.ව. 10.50 |
| 38. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.රත්නසිරි මහතා | පෙ.ව. 11.00 |
| 39. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.ඒ.දේවින්ද කුමාර මහතා | පෙ.ව. 11.30 |
| 40. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මාලනී පීරිස් මිය | පෙ.ව. 12.30 |
| 41. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා | පෙ.ව. 12.30 |
| 42. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රවීන් විනෝද් මහතා | පෙ.ව. 12.30 |

| | | | |
|---|---|---|---|
| 43. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.එච්.අසංක එරන්ද මහතා | පෙ.ව. 12.30 |
| 44. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | බී.ජී. ජීවන් අබේවික්‍රමපාල | පෙ.ව. 12.31 |

**01-01 <u>පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.-(22.05.20)</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්කේ.එම්.එස්.ධනවර්ධන මහතා :-</u>**

2022.05.20 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී</u>** ශ්‍රී ප්‍රේමා ගමිලත් මිය **<u>:-</u>**

22.05.20වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා :-</u>**

ගරු සභාව පසුගිය මස අවසන් කල අවස්ථාවේ මා විසින් කල ප්‍රකාශය සටහන් කර නැත.පසුගිය මැයි 9 දින සිදුවීම අවස්ථාවේ ජ.වි.පෙ.විසින් පහර දුන්නා යන්න මම ප්‍රතික්ෂේප කරනවා.සාක්ෂි තියේනම් ඉදිරිපත්කරන්න.සාධාරන පරීක්ෂනයක් කරන්න.

**<u>- ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

**සභාව නිම වූපසු දේ වාර්තා කරන්නේ නෑ.එසේම මේ සංශෝධන අවස්ථාවයි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-</u>**

**සභාව අවසන් වූපසු ප්‍රකාශ කලේ.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා :-</u>**

මට බාධාතිබුනා. ඒ ගෝෂාව තුල ප්‍රකාශය ට බාධා තිබුනා.මම නැවතත් ඒ තත්වය ප්‍රතික්ෂේප කරන අතර සාක්ෂි තියේනම් ඉදිරිපත් කරන්න.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

මට විශ්වාසයි.මේ හැම කටයුත්තකටම ජවිපෙ කීප දෙනෙක් මුල් උනා. මේ සිදුවීමට විමර්ශන තියෙනවා.මට පක්ෂ සාමාජික කාඩ් ගේන්න බැරිවෙයි.ඔප්පු කරන්න.නමුත් මම ඒ ප්‍රකාශ කරනවා.එදත් බස් ගිනිතිබ්බා.දේපල ගිනි තිබ්බා.දිද්දෙනිය පැක්ටරිය ගිනි තියලා.රැකියා නැතිඋනා.ගම්වල මිනි මැරුනා.අදත් ඒ පරන ගති මතු කරලා .මම නැවතත් කියනවා.මට වේදනයි.මම දන්න දේ ඔප්පු කරන්නළු.මට අර කාඩ් දෙන්න නෑ.ඒ අයයි ඒක කලේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා :-</u>**

මේ තාක්ෂන දියුණුව එක්ක වීඩියෝ තියේනම් පුළුවන් ඔප්පු කරන්න.හඳුනාගන්න පුළුවන්.මේ ප්‍රකාශයෙන් පස්සේ පොලීසියට කතා කලා.මම විමසුවා.මේක ජාතික ප්‍රශ්නයක්.අපිමත පටවන්න උත්සහා කරන්න එපා.පොලිස්පති හමු උනා.සාක්ෂි නෑ කීවා.මතයක් හදන්න උත්සහ කරන්න එපා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා :-</u>**

රීති ප්‍රශ්නයක්.වාර්තාව සංශෝධනය අවස්ථාවේ වෙනත් කරුනු පුළුවන්ද?

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

මම ඒබව දැනුවත්කලා.මේ ඇසූ ප්‍රශ්නයට උත්තර දුන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**

පසුගිය ජල කමිටුවේ නය දීම මන්ත්‍රීතුමන්ලාටත් දුන්නද යන්න මම විමසුවා.සේවකයන්ට පමනක් දුන් බව ප්‍රකාශ උනා.ව්‍යාපාතියේ එසේම ආදායම් වියදම් දෙන්න.

**Xxxxxxxxxxxxx** 22.05.20වන දින මහ සභා වාර්තාව **ඒකමතිකව මහා සභා සම්මත විය.**

**Xxxxxxxxxxx**

**ප්‍රේමරත්න මල්කැකුල,**

**සභාපති, ප්‍රාදේශිය සභාව,කුරුවිට.**

2. **සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන -නොමැත.**

**3. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද ලිපි සංදේශ , පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන -නොමැත**

**4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :- නොමැත**

**5. යථා පරිදි කල්දී ඇති යෝජනා :-**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**05-01.** **කුරුවිට බෝපත්ඇල්ලට පැමිනෙන සංචාරකයන්ගේ ප්‍රයෝජනය සඳහා දැනට ප්‍රාදේශිය සභාවේ ඇති පැරණි 53-5633 කැබ් රථය සුදුසු පරිදි අළුත්වැඩියා කර මුදලක් අයකර ,ඇල්ල රථගාලේ සිට බෝපත්ඇල්ල දක්වා ප්‍රවාහන කටයුතුවල යෙදවීම සම්බන්ධ යෝජනාව.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**කුරුවිට බෝපත්ඇල්ලට පැමිනෙන සංචාරකයන්ගේ ප්‍රයෝජනය සඳහා දැනට ප්‍රාදේශිය සභාවේ ඇති පැරණි 53-5633 කැබ් රථය සුදුසු පරිදි අළුත්වැඩියා කර මුදලක් අයකර ,ඇල්ල රථගාලේ සිට බෝපත්ඇල්ල දක්වා ප්‍රවාහන කටයුතුවල යෙදවීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ප්‍රේමා ගම්ලත් මිය -**

**එම යෝජනාව ස්ථිර කරමි**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**වාහන බොහොමයක් අපේ රථ ගාලට ඇතුල් නොකර යනවා.ඒ යන්නේ දුරත් නිසා.අපේ භාවිතයේ නැති පැරණි 53-5633 කැබ් රථය සුදුසු පරිදි අළුත්වැඩියා කර මුදලක් අය කරලා මේක කල හැකියි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**

මේ වැඩසටහනට එකඟයි.නමුත් මේ කැබ් රථය අළුත්වැඩියාව, සැකසීම කුමන විධිහටද?

<u>ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
ආසන හදලා.ඉඳගෙන යන විධිහට.පිටිපස කොටසේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

මේ වාහනය ඇන්ජින් බොඩි නෑ.සේරම අළුත්වැඩියා කරන්න ගානක් යයි.ඊලඟ කරුන මේක සංකල්පයක්.ගැටළු තියෙනවා.බැටරියෙන් වැඩ කරන ඒවයි ගැලපෙන්නේ.පිටිපස්සේ යන්න හැකි 6 දෙනාටයි.දොරවල් නිතර කැඩෙනවා.නිතර අරින්න වහන්න බෑ.හොඳම බොලරෝ එක්.ඇන්ජිම වැඩක් නෑ.අළුතින් ඇන්ජිම තියලා බොඩිය තියන්න වෙයි.

<u>ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

දෙපැත්ත ලෑලි ගහලා.ගන්නයි මට හිතුනේ.රු.25000 ක විතර.පොඩි දුරක් යන්න වෙන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

කතරගම හදලා තියෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා</u>
අපේ රථගාලට නොයා යම් වාහන ඇතුලට යනවා.හෝටල වලටත් යනවා.ඒ ටිකදුර අපේ වාහන වල යයිද?දිගටම යන්න හැකියාව තියෙද්දි?මෙතන ඉඳන් මීටර් 600 වගේ තියෙන්නේ.මේක අමාරුම අය ඇර වාහන වල යයිද?එතන තාමත් කඩ ටිකක් තියෙනවා.ඒ ටිකේ මිනිස්සු පයින් යනකොට යම් ආදායමක් එනවා.මම කියන්නේ  මේ කටයුත්ත එපා කියපා නෙමේ.මේකත් හිතන්න.වාහනය නඩත්තු මුදල බලනකොට ආදායම් ප්‍රමානවත් වෙයිද?රියදුරුට ගෙවිය යුතුයි.අපි දන්නවා සබාවේ වාහන නඩත්තුවත් අමාරුයි.ඒ නිසා හිතන්න. තාම පාරේ කඩ තියෙනවා.සුළු ආදායමින් ජීවත්වන මිනිස්සු.මේ කරන දෙයින් මතයක් එන්නත් පුළුවන්.එන සුළු ආදායමටත් පහර වදින බවට.මතක්කිරීමකුයි කලේ. සාකච්ඡා කරලා හොඳනම් කරමු.මට හිතෙනවා මේ වියදම් එක්ක මේ වෙලාවේ සභාවට නව ආදායම් ඕනි.නමුත් තක්සෙරු නොකර කරලා පාඩු උනොත් ? ගැටළුවක්.මගේ අදහසයි ඒක.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේශ් මහතා</u>
නව අදහසක්.පඩිපෙල ලඟ ඉඳන් දූපත් වලටත් ප්‍රවාහනයක් යෙදෙව්වොත් හොඳයි. පොඩි පාරුවක් දැනට තියෙනවා.දූපත් දක්වා පොඩි බෝට්ටුවක් වගේ .ඇතැම් තරුන ජෝඩු මේ දූපත් නරඹන්න ගියාම බීමත්ව හැසිරෙන අය නිසා ගැටළු ඇති වෙනවා.එසේම මත්පැන් ගෙනිහින් ඒ බෝතල් එහෙමම දාලා ආවාම කකුල් කැපෙනෙවා.සංචාරක ආකර්ශනයට ගැටළුවක්.
මේ විනෝදයට මත්පැන් පානය කලත් ඒක යම් තැනක වෙනම අනිත් අයට කරදරයක් නැතුව කරන්න කාමරයක් වගේ හදලා දිම සුදුසුයි.ගැලපෙනවද බලල කරන්න.අදහසක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා</u>

මීට පෙර කල යුතුව තිබූ කටයුත්තක්.කැබ් රථය හොඳට තියෙනවද?පොත තියෙනවද?මේ වගේ වාහන වෙනස් කරලා අනතුරක් උනොත් හෙම ගෙවන්නේ නෑ.ඉන්ධන හා වාහනයට කැලි ගන්න ගියාම ලොකු බරක්.රියදුරු සභාවේ ඉන්න අයෙක්ද?අනතුරු උනොත් ගැටළු.මේ අවස්ථාවට උදිත නෑ.විශාල වියදමක් දරලා හැඳුවට දිරනතුරුම දුවන්න බැරි උනා.ජනතා බදු මුදල් අපතේ යයි.තාවකාලිකව මේ කටයුත්ත නවත්තන්න.

ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා

විකසිත මන්ත්‍රීතුමා කීවා සුළු වෙලෙන්දන්ට වෙළඳාමට පහර වදිනවා කියලා.එසේම වාහන හෝටලයට යනවළු.ඒත් හෝටලයට යන්නේ නෑ.ඒකේ පාක් එකට යන්නේ.මුදල් කඩනවා.රු.200 වගේ.ඇල්ලටයි යන්නේ .පහසුවට.ඒත් මංහිතුවේ ඒඅයට සහන මුදලකට යන්න.සේවයක් සලසන්නයි හිතුවේ.විමසලා ක්‍රමවේද හදන්න ඕනි.දෙපස කඩ කිසා පාරට අවහිරයි යන්න කියලයි කියන්නේ.ඇල්ලට වැසිකිලි හදලා.කඩ හදලා නෑ තාම.ක්‍රමවත්ව ඒ වැඩේ කල යුතුයි.පුද්ගලික භූමිවල ඒවා ඉවත්කරන්නබෑ.රථගාලේ තමා ව්‍යාපාර දාන්නෙ

අපේ අමතර ඉන්න රියදුරෙක් තමා මේ කටයුත්තට යොමු කරන්නේ.

මේ අවස්ථාවේ සභාවේ ගෝෂා පැවතුණි.
මේ යෝජනාව කලේ වාහනය වසර ගනනක් තිබුනා.ලක්ෂ 4ක් විතර වියදම ගියා.රක්ෂනය කලාට ජ්සේ කරන්නේ.සභාව එකඟ නැත්නම් අවශ්‍ය නෑ.ගැටළුවක් නෑ.බොලෙරෝ එක හදන්න බෑ.දිරලා.කරනවනම් මේක තමා පුළුවන්.නමුත් සභා තින්දුවක් නැතිව බෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ.විජේසිරි මහතා

පොලවට පස්වෙයි.නිකම්ම.මේ කටයුත්ත සේවයක් ලෙස කරමු.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-
තාක්ෂන වාර්තාවක් ගන්න.

ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා
එකඟයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසුරිය මහතා

මේ කටයුත්තට යන ආදායම වියදම තක්සේරු කර එය සභාවට ඉදිරිපත්කරන්න.ඉන්පසු තින්දුවක් ගමු.

ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා

පීනන්න පෙර ගැඹුර හොයන්න බෑ.විශාල වියදමක් කරන්නැතිව දෙපැත්තට ලෑලි ගහලා වහලය නැතිව හදලා ඉරිදා සෙනසුරාදා සෙනඟ සඳහා විතරයි යොදවන්න හැදුවේ.ඒ නිසා මේ කටයුත්ත

**පිලිබඳව සම්පූර්න තාක්ෂන වාර්තාවක් ඉදිරි සභාවට යොමු කරමු.ඉන්පසු ඉදිරි කටයුතු සිදු කරමු.එසේ තීරනය කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට බෝපත්ඇල්ලට පැමිනෙන සංචාරකයන්ගේ ප්‍රයෝජනය සඳහා දැනට ප්‍රාදේශිය සභාවේ ඇති පැරණි 53-5633 කැබ් රථය සුදුසු පරිදි අළුත්වැඩියා කර මුදලක් අයකර ,ඇල්ල රථගාලේ සිට බෝපත්ඇල්ල දක්වා ප්‍රවාහන කටයුතුවල යෙදවීමට කටයුතු කිරිම සඳහා මෙම ව්‍යාපෘතිය සම්බන්ධ සම්පූර්න තාක්ෂන වාර්තාවක් ලබාගෙන මහා සබාවට ඉදිරිපත්කර ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-02.සභා බල ප්‍රදේශයේ ජනතාව සඳහා ගලි සේවයක් පවත්වාගෙන යාම සඳහා සභාව සතු පොහොරබාව පොහොර ව්‍යාපෘති භූමියේ ගලි ද්‍රව්‍ය බැහැර කිරිමට ක්‍රමානුකූල ගලි වලක් සැකසීම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**සභා බල ප්‍රදේශයේ ජනතාව සඳහා ගලි සේවයක් පවත්වාගෙන යාම සඳහා සභාව සතු පොහොරබාව පොහොර ව්‍යාපෘති භූමියේ ගලි ද්‍රව්‍ය බැහැර කිරිමට ක්‍රමානුකූල ගලි වලක් සැකසීම ට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා</u>

**ඉතා හොඳයි.දෙල්ගමුව අයත් අහනවා ගලි සේවය පිලිබදව.මම කීවා වලක් නැතිබව.ගම්බදත් මේ ගැටළුව තියෙනවා.වැසිකිලි වලවල් පිරිලා.ගමේ විරෝධතා නැත්නම් ක්‍රම වේදයක් අනුව හදන්න ඉතාම වටිනවා.ස්ථිර සේවයක්.රත්නපුර නගර සභාවේ සහායත් ගන්න පුළුවන්.දැන් ඒකත් බුක් කරන්නත් බෑ.ආදායම් ලැබෙනවා.ස්ථානය පරික්ෂා කරලා ගම් වාසීන් එක්ක කතා කරලා බලන්න. ඒ අය විරුද්ධ උනොත් ගැටළුවක්.උපරිම සහාය දෙනවා මේ කටයුත්තට.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා</u>

**ස්ථිරයි.අසංක මන්ත්‍රී තුමා කිවා වගේ ජනතාව මේ සේවය අහනවා. පුද්ගලික සේවා තිබුනත් විශාල වියදමක් යනවා.ඒ අය වැඩිපුර අය කරනවා.සභාව මැදිහත්වෙලා කලොත් විශේෂයි.කාලෝචිතයි.කසල අංගනය ඉඩමේ කිසිදු ගැටළුවක් නැතිව සියළු තාක්ෂන වාර්තා අරන් ඉංජිනේරු සහාය අරන් කරමු.මේක විශාල ආදායමක්.අන්ත දුගී අය නෙමේ මේ සේවය ගන්නේ.මධයම පන්තියේ අය.සාධාරන මුදලකට කරමු පාඩුත් නැතිව.**

ඉන්ධන ගානත් බලලා කලින්ම ස්ථාවර සාධාරන මිලක් නියම කරලා කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්කේ.විජේසිරි මහතා</u>

පොහොරබාව කසල අංගනය කරන කොට ගැටළු ආවා.නඩු කියලා සමතයකට ඇවිත් පීඩා අවම කලා.දැන් මේ ගලි සේවයක් ජල මූලාශ්‍ර ආදියට හානිනොවන ලෙස සැකසිය යුතුයි. ජල මූලාශ්‍ර තියෙන්නේ වටේ.ඒනිසා නිරික්ෂනය කරලා විධිමත්ව මේ කටයුතු සිදුවිය යුතුයි. විරෝධතා එන්න හැකි උනත් මේක අතවශ්‍ය සේවයක්.පොලවට බාදනය නොවන ලෙස ගැටළු නොවන ලෙස විධිමත්ව කරමු.සභාවට සම්පතක්.ආදායමක්.මෙවැනි දේ තුලින් ජනතාවට විශාල සේවාවක් වෙනවා.අපේ සහාය අපි ලබා දෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

විජේසිරිමන්ත්‍රී තුමා කීවා වගේ තාක්ෂනික පරිසරයක මේ කටයුතු කරන්න අවශ්‍යයි.ගිමන්හල හැදුවා.අපිට ජනතාව ආමන්ත්‍රනය කරන විධිහ දන්නවා.වැසිකිලියේ මූත්‍රා පිටවෙනවා.ඉංජිනේරු සහාය ගෙන කරන්න.බලංගොඩ නගර සභාවේ ගැටළු නෑ.රත්නපුර නගර සභාවත් සාර්ථකයි.ගමට නගරයට දෙකටම සේවයක්.ගලිය ප්‍රයෝජනයට ගත්තේම නෑ.ලක්ෂ 25 පමන. ඉංජිනේරු සහාය ගෙන කටයුතු කරමු.16 වෙනිදාට අපි මේගැන සාකච්චාව යොදාගමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශ්‍රී නයනා ජීවනි මිය.</u>

කාලෝචිතයි.පසුගිය වර්ෂා කාලේ පර්.5,6 ක ජීවත් වෙන අයට වැසිකිලි උතුරලා වර්ෂාව කාගේ විශාල ගැටළුවක්.මුදල් බැන්දත් ගලි සේවයට බලා ඉන්න ඕනි.අපි සහාය දෙනවා මේ කටයුත්තට.රු.10000ක් විතර ඇති දැන් මේ සේවය පිටින් ලබාගන්න කොට. අපිට ගලි දෙකක් තියෙනවානම් හොඳයි.ඊලග වැසිකාලෙට පෙර කරමු.ප්‍රෙද්ශයට අත්‍යවශ්‍ය සේවාවක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශ්‍රී මදූෂානී බන්ඩාර මිය.</u>

විධමත්ව කල යුතුයි.පාසැලට කිසිදු ගැටළුවක් ඇති නොවන ලෙස කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ධර්ම දාස මහතා</u>

නිසි පරිදි වාර්තා ගෙන කටයුතු කරන්න.සෝමරත්න මන්ත්‍රීතුමා කිවා කුරුවිට නගරයේ වැසිකිලි වල තාම ස්ථිර විසඳුම් නෑ.විශාල මුදලක් වියදම් කලා.ඒ වගේ අඩුපාඩු නැතිව ස්ථිර ලෙස ඵලදායි සේවයක් කරන්න.බලංගොඩ ඉතාම හොඳින් කරනවා.ක්‍රමවේද අනුව කරන්න.පාසැලක් තියෙනවා. අනෙකුත් ගැටව පිලිබඳ සොයා බලලා කරන්න.වැසිකාලේ ජනතාවට ගැටළු විශාලයි. මේ සම්බන්ධව.ලැට් උතුරනවා.රත්නපුරෙත් සේවය ගන්න අමාරුයි.සභාවට ගලි සේවයක් අත්‍යාවශ්‍යයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා

මේ ප්‍රෙද්ශයට අත්‍යවශයයි.කුඩා ඉඩම්වල ජනතාව ඉන්නේ.මේ ප්‍රෙද්ශයේ ජනතාව මෙය ඉදි කිරීමේදි වෙන විධිහකට ගන්න පුළුවන්.අපි ඒ පැත්තේ අවධානය යොමු කරලා ප්‍රයෝජනය අවබෝධ කරලා තාක්ෂන උපදෙස් ලබාගෙන , තියෙන තැන්වලින් අත්දැකීම් ගමු.ඒ හරහා හොඳම විධිහට කරමු.මේ අවස්ථාවේ ආදායම වැඩිකරගන්න මෙක උචිතයි.මධ්‍යම පාන්තික පිරිස් මේ සේවය ලබා ගන්නවා වැඩියි.අපිට ආදායම් වැඩි මාර්ගයක්.නමුත් ඉතාම නිවැරදිව තාක්ෂනය උපරිම සුදුසු ලෙස යොදවලා කටයුතු කල යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඍ මුදිතා ශ්‍රීමතී මිය.

නිවැරදිව මහජනතාව දැනුවත් කරන්න.විවිධ විරෝධතා එන්න පෙර නිවැරදි දැනුවත්කිරිමක් ඕනි.මේ කටයුත්ත වැදගත්.ගංවතුර නිසා වැසිකිවල ගැටළු.ඒ නිසා මෙය වැදගත්.ඉතා නිවැරදිව ක්‍රියාත්මක කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනංජය වීරසේකර මහතා

ගියවර මේ ඉඩමේ කටයුතු වලට අභියෝග තිබුනා.මහජනතාව දැනුවත්කරන්න.පාසැල, ක්‍රීඩා පිටිය,නිවාස ආදිය තියෙනවා.පෙර වතාවේ ලෙස නැතිව විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමාලත් සහාය වෙනවා.විධිමත්ව කරමු.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-

ස්වේඡා සමිති ,ගරු පරනගම මන්ත්‍රීතුමිය,ධනංජය ගරු මන්ත්‍රී තුමා විජේසිරි මන්ත්‍රීතුමා ,ජනතාව දැනුවත්කරලා අපි මෙක කරමු.කට්ටිය කැඳවමු.16 දිනදි මේ කටයුතු යොදාගමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා

පාසැල,විදුහල්පති,සංවර්ධන කමිටුවෙනුත් කැඳවන්න.එවිට වැරදි මත සමාජගත කල නොහැකියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා

මෙය ඉල්ලුමක් තියෙන ව්‍යාපෘතියක්.නමුත් ක්‍රියාත්මක කිරීමේදී ගැටව එනවා.දැනටත් විරෝදතා නොකියා කියනවා.අහවනවා.මේ වගේ දේවල් අතුරු ව්‍යවස්ථා සම්මත කරගෙන කරම්.නිදහස්.පනතේප්‍රධාන ලෙස නෑ.නමුත් අපිට අතුරු ව්‍යවස්ථා සම්මත කරල කරන්න පුවවන්.රටේ නැති විරෝධතා එයි.ඒකට උත්තර අපි සකස්කරගන්න ඕනි.චෝදනා එයි.අද උද්ගෝෂන හැමතැනම හැම දේටම.ඒනිසා බුද්ධිමත්ව කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන  මහතා

වැදගත්.මගෙනුත් මේ ගැන ජනතාව අහනවා.බැහැර කරන්න තැනක් නැති බව කියනවා.මේ මුලදී අපි ඉඩම පවරා ගත්තා .නමුත් දීර්ග කාලයක් ගියා කටයුතු අරඹන්න.ඒනිසා මේ කටයුත්ත

ප්‍රෙද්ශයේ මන්ත්‍රිලා එකතුවෙලා කතාවෙලා අපි සියළු ගැටළු විසඳගෙන මේක කරමු.ගැටළුවලට එක්වමුනදෙමු.කඩාකප්පල් කරන්න බැරි ලෙස සියළු දෙයින් පූර්න වෙමු.නැත්නම් කරන්න බැරි වෙයි. මට දැනෙන දේ.සියළු දෙනා එක්ව මේ කටයුතු කරමු.නිවැරදිව කලොත් කාටවත් මේක කඩා කප්පල් කරන්න බෑ.අර කුළුනු වලට අපි අවසර දුන්නා.ඒ අය බෑ කියන්න බැරි විධිහට සේරම අවසර රුගෙන එන්නේ. ඒ වගේ අපිත් ලෑස්ති වෙමු.

<u>ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

මගේ යෝජනාවට සභාවේ විෂේශයෙන් කරුනු දක්වමින් එකගත්වය ලැබුනා.දීප්ති මන්ත්‍රිතුමා කිවා වගේ අකැමති අය ඇති.අපි සියළු අවසර අරන් පරිසර ,සෞඛ්‍යපරීක්ෂක,විදුහල්පති ආදි ශිශ්‍ය සංගමය විහාරයේ හාමුදුරුවෝ ස්වේජා සංවිධාන අදාල සියළු අංශ  කැඳවගෙන සාකච්ජා කරමු.ව්‍යාපෘතිය හදමු.කුරුවිටට විතරක් නෙමේ මේ ගැටළුව තව වසර  ගානක් යනකොට තවත් මේ ගැටළුව වැඩි වෙනවා.අපේ තියෙන ගල වලින් ප්‍රයෝජන ගන්න ඕනි.උප සභාපතිතුමා කීව ලෙස 16 දාට සුදුසු අය කැඳවන්න.සියළු ගරු මන්ත්‍රි තුමන්ලා සහභාගී වෙන්න.අපේ කෘෂි ගෙවතු කම්ටුවත් එදාට එනවා.පොහොරබාව ඉඩමට.මතය මොකක් උනත් එන්න.නයනා මන්ත්‍රිතුමියටයි කස්තුරි මන්ත්‍රිතුමියටයි විධිහක්නෑ.

මේ අවස්ථාවේ ගෝෂා පැවතුනි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්.සෝමරත්න මහතා</u>

රිතිය අනුව මන්ත්‍රිවරයෙක් අදහස් දක්වන විට කතාව ට බාධා නොකල යුතුයි.අවසන් වුවිට නැගිටලා කතා කල යුතුයි.

<u>ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

තම තමන් ස්වයං විනය ඇති කරගන්න.

අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා    විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව සභා බල ප්‍රදේශයේ ජනතාව සඳහා ගලි සේවයක් පවත්වාගෙන යාම සඳහා සභාව සතු පොහොරබාව පොහොර ව්‍යාපෘති භූමියේ ගලි ද්‍රව්‍ය බැහැර කිරිමට ක්‍රමානුකූල ගලි වලක් සැකසීම ට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

**2022.06.10 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-03 උද්ධෘතය**

**05-03.පසුගිය සමයේ රටේ ඇතිවූ ගැටුම්කාරී තත්වය හමුවේ කුරුවිට ප්‍රාදේශිය සභාවට හා බල ප්‍රදේශයට මැනවින් ආරක්ෂාව සැපයූ කුරුවිට පොලිස් ස්ථානය වෙත ස්තූතිය පල කිරීමේ යෝජනාව**
**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**පසුගිය සමයේ රටේ ඇතිවූ ගැටුම්කාරී තත්වය හමුවේ කුරුවිට ප්‍රාදේශිය සභාවට හා බල ප්‍රදේශයට මැනවින් ආරක්ෂාව සැපයූ කුරුවිට පොලිස් ස්ථානය වෙත ස්තූතිය පලකිරිමට යෝජනා කරමි.**
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා**

**එම යෝජනාව ස්ථිර කරමි.**

මේ යෝජනාව හොඳයි.තව අපිට එදා බොලෙරෝව ගිනි තියපු වෙලේ කුරුවිට යුධ හමුදා කඳවුරේ විශේෂ මැදිහත්වීමක්කලා.උප සබාපතිතුමා කතා කරලා අසංක මන්ත්‍රතුමත් මැදිහත් අනා.හමුදා අනුකන්ඩ දෙකක් සති දෙකක් ආරක්ෂාව දුන්නා.විශේෂයෙන් ස්තුති කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා</u>

පොලිසියට ස්තුති කල යුතු නෑ. ලංකාව පුරා අකටයුතු උනා.පොලිසිය බලා හිටියා.වාහන ගිනිතිබ්බා.කැඩුවා. පොලිසිය බලා උන්නා.ගමේ මින්ස්සු සාමකාමියි.අපේ ප්‍රෙද්ශවල ගැටළු නෑ.ගමේ මිනිස්සු සාරධර්ම රැක්කා.නමුත් ගෝල්පේස් වල ජනතා දේපල හානි උනා.එදා නාලන්ද සාතන දිනවල විශාල ගිනි දැල්වුනා.නමුත් දොඩම්පේ විත්තිකාරයන් හිටියත්මම ඒ පැත්ත බලා ගත්තා. ගිනි නෑ.දේපල හානි කලේ නෑ.මහින්ද ජානක සරත් කැළුම් කාටවත් අනතුරු නෑ.හදවත් තියෙන අය අනුන්ගේ ගෙයක්,දේපලක් ගිනිතියන්නේ නෑ.මේ අවස්ථාවේත් ස්තුති කල යුත්තේ සාමය රැකපු ගම්වල ජනතාවට.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

සත්‍යයක් බෙහෝ දුරට කුරුවිට අවට අපේ සම්බන්දතා ශාඛා මට්ටමින් මැතිවරන වලදිත් අපි සාමය රැකගත්තා.සභාවේ කැබ්රථය ගිනි තැබීම වෙනම සිද්ධියක්.වෙන මොක්තු ගැටළු නෑ.සමාජ මාධ්‍ය ජාලාවල නම් තිබුනා .ජයරත්න මන්ත්‍රී තුමා කියනවාවගේ ඒක උපන් ගති.අපි ගමේ ජීවත් වෙන ආකාරය අනුවයි ප්‍රතිදාර තිබුනේ.පාසැල් උද්ගෝෂන තිබුනා.කැගහල ගියා. ඒක ඒ අයගේ අයිතිය. සාමකාමී අරගල.නමුත් ෂෙඩ් ලඟ කල එක වැරදියි.යන වාහන වලින් මුදල් ගත්තා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී නයනා ජීවනි මිය.</u>
අපි ගැටළු පාලනය කලා.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

පොලිසිය ඉන්නේ සාමය රකින්න.යම් ප්‍රචන්ඩ යමක් සිදුවෙනවා නම් ජනතාව ආරක්සා කරන්න.ග්‍රාම නිලධාරිටත් පුළුවන්.ස්තුති විශේෂයෙන් අනවශ්‍යයි.ඒක රාජකාරිය. නමුත් රාජකාරිය දේව කාරිය කරගෙන ඉන්න අයට ප්‍රනාමය.නමුත් ඉහල නිලධාරනි ගන්න තීන්දු අන්ව ඒ අයට කටයුතු කරන්න වෙනවා.ප්‍රචන්ඩත්වය නරක නමුත් උද්ගෝෂන අයිතියක්.ඒත් මංකොල්ලකෑම් දේපල හානිය අයිතියක් නෙමේ.සාමය රැකිය යුතු අය ප්‍රමාද විම නිසා හානි වැඩිඋනා. එසේම සමහර වෙලාවට ආරක්ෂාව අනිවාර්යෙන් සැපයියයුතුයි.නීති ආරක්ෂාව ඔබතුමාට දෙන්න ඕනි. බැඳී ඉන්නවා.නමුත් ඒක උනේ නෑ.

අපි 45 ම අභියෝගවලට ලක් උනා.නමුත් මම දැක්කේ නෑ ආරක්ෂාවක්.නිලධාරින් රාජකාරිය කල යුතුයි.සෝමරත්න මන්ත්‍රිතුමා අසංක මන්ත්‍රිතුමා,ලේකම්තුමිය මැදිහත් අනා.සාමූහිකව සභාවත් මැදිහත්උනා.සමාජ සිද්ධාන්ත මැදිහත්උනානම් හොඳයි.නාලන්ද සාතනයේ පාර්ශවය පීඩාවටපත්වෙලා.පාඩමක් ඉලෙන ගත්තා.ඒ බය මිනිස්සු තුල තිබ්බා.රත්නපුරේ ඒවගේ දේ කලේ නෑ.මිනිස්සුන්ට ගරු කල යුතුයි.ඉතා අවම සිද්ධි කුරුවිට.මින්සුන්ට ගරු කල යුතුයි.කිරිඇල්ල සිදුවිම් නෑ.රතිඤ්ඤා නෑ.ප්‍රචන්ඩ නෑ.අතිශයෝක්තිය නෑ.රාජකාරිය මැනවින් කලාට ප්‍රසාදය තියෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී දයා කස්තුරි මිය.</u>

මේ ප්‍රශ්නෙදි අපිටත් කෝල් කලා.ගහනවා කීවා.ස්තුති කරනවා විකසිත ගරු මන්ත්‍රිතුමාට අපිට ගමේ කිසිදු කරදරයක් උනේ නෑ.අපේ ගමේ.හොරාකාලා නෑ අපි.මගේ මහත්තයා දිර්ග කාලයක් විදේශ ගතව හම්බු කලා.අපිට ඇතිතරම් .ගැටළුවක්නෑ.අපි විපක්ෂයටත් ස්තුති කරනවා.කරදරයක්නෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

විපක්ෂෙට තියෙන බලතල මොනවාද? ආරක්ෂාව දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අයි.කේ.කුලරත්න මහතා</u>

මේ අවස්ථාවේ අපි ඒවා කලේ නෑ.ගිනිතිබ්බේ නෑ.සාමය රැක්කා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි සම්පත් බොතේජු මහතා</u>

අවංකව ස්තුති කරන්න ඕනි කුරුවිට පොලිස් ස්ථානයට ගඳ දැනිලයි ඇවිත් තියෙන්නේ .කිසි පැමිනිල්ලක් නෑ. නමුත් ඇවිත් සොයා බලලා කටයුතු කලා.දේව කාරියක් ලෙස කරලා.ආරක්ෂක අංශ හිටියත් සිල් ගත්ත නයා වගේ හිටියාම බෑ.නමුත් ප්‍රධානින් දුන්න උපදෙස් අනුවයි කටයුතු කරන්නෙ ඒඅය.ඒ වගේම හිතට දුකයි.ගමේ ජීවත්වුන විධිහටයි ප්‍රතිචාර කියපු කතාවට. මොකද මම ගමේ ජීවත්වන විධිහ අනුව.මටයි ප්‍රශ්න වුනේ.හිතට අමාරුයි.කරඳන විදුහල්පතිතුමාගේ කාලේ සිට මම මේ සමාජ සේවය පටන්ගත්තේ.එතුමා පවා දන්නවා මම කව්ද කියන්න.කෙසේ වුවත් ආරක්ෂක අංශ වලටත් ප්‍රචන්ඩ අයටත් ස්තුතිය.දයා කස්තුරි මන්ත්‍රිතුමිය කීවා වගේ ඒ අයටත් ස්තුතියි.ගිනි තිබ්බේ නැති නිසා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දීප්ති චන්දන මහතා</u>

මම මේකේ දෙපැත්තක් දකිනවා.ජයරත්න මන්ත්‍රිතුමාගේ අදහස ජනතා හොඳකමට ගැටළු නැතිවුනා කියලා.පොලිසිය නිසා නෙමේ කියලා.ඒකත් ඇත්ත.හැබැයි එහෙම වෙන්න හේතුත් තියෙනවා.ඔවුන් නිරායුධව යන්නේ.සීයක් එක්ක පොලිසියට ගැහුවත් කතා නෑ.හැබැයි ඒ අය ගැහුවොත් සේරම සමාජ මානව හිමිකම්,නීතිඥවරු ඉන්නවා.ඒ අයටත් දරුවෝ පවුල් තියෙනවා.ඒ නිසා අවශ්‍ය වෙලාවට විතරක් එනවා.මේ පොලිසියට හමුදාවට තියෙන නීති රාමුව මදි.වැඩිකරන්න ඕනි.අපි ජීවත්වුන විධිය හොඳ නිසා කියන එක අපි හොඳට හිටියට උපාසක වගේ හිටියොත් බෑ.කීප දෙනෙක් එකතුවෙලා කඩාකප්පල් වැඩ කරනවා.13 දා මන්ත්‍රිවරුන්ට තර්ජනය කරලාදාපු කෙනෙක් ඉන්නවා.නයනා මන්ත්‍රිතුමිය දැම්මේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ණී නයනා ජීවනි මිය</u>

මම මෙය ප්‍රතික්ෂේප කරනවා.මගේ මුහුණු පොත බලන්න.පෙන්නන්න.අදටත් මම මේකට වගකියන්නේ නෑ.කිසිදා දාලා නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඹී දයා කස්තුරි මිය

වට්ස් ඇප් දාලා තිබුනේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඹී නයනා ජීවනි මිය

පෙන්නන්න.ස්ක්‍රීන්ෂොට් ඇතිනේ.මම කිසිදා එවැනි වැඩ කරන කෙනෙක් නෙමේ.මට එවැනි මානසිකත්වයක් නෑ.තියේනම් මට ඔය පෝස්ට් එක ඔප්පු කර පෙන්වන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති වන්දන මහතා

මම ඔප්පු කර පෙන්වන්නම්. මම මෙය කීවේ වගකීමෙන්.නමුත් එය මම කීවේ මේ අපිව ආරක්ෂාකරනවා කියලා බොරුවට කියන නිසා.ඒවාට එකඟ පිරිස මදි නිසයි අපි බේරුනේ.ගෝනපිටියටත් සලකමුද කියලා තිබිලා.සලකන්න රිප්ලයි නැතිනිසා බේරුනා.

අපිට ගහන්න ඕනි නම් ගහන්න.බනින්න.ආන්ඩුව සභාව ගන්න ඕනිනම් ගන්න.මම ආයේ ජන්දේ ඉල්ලන්නේ නෑ.මාස දෙක තුනට තරහා වෙන්න ඕනි නෑ.නම කීවේ අන්ත් අයත් දැක්කා.බොරු කියන්නෑ.සාක්කි දයා මන්ත්‍රිත් දැක්කා.යමක් ලැබේනම් කරන්න.මම විශ්වාස කරන්නෑ අපිව බේරුවා කියලා.ගමේ සූදානම් උනේ නෑ ඒ වගේ දේවලට.ඒකයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඹී නයනා ජීවනි මිය

මේ චෝදනා තරයේ ප්‍රතික්ෂේප කරනවා.මට ලබන සභාවේදී ඔප්පු කර පෙන්වන්න.මම කිසිදා මෙවැනි දේට රතිඥ්ඥාවක් වත් පත්තු කර නෑ.මම මම මගේ ආසන්න පදිංචි සම්පතමයන් පිලිබඳ සොයා බැලුවා.ඔවැනි චෝදනා මා බාර ගන්නේ නෑ.වට්ස් ඇප් පවා මම දාන්නේ වැදගත් යමක් පමනයි.මගේ නමට තියෙන එක විතරයි මට තියෙන්නේ. මුහුනු පොත.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඹී දයා කස්තුරි මිය

කමෙන්ට් දැම්මේ නෑ.කවුරුත් බයේ හිටියේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඹී නයනා ජීවනි මිය

අපේ ගමේ සහෝදරවරුන්ට විරුද්ධව මම ඒවැනි දේ කරන්නෑ.මිනිස්සු ප්‍රකෝපකරවන්නේ නෑ. ලබන සභාවේදි දිප්ති මන්ත්‍රි තුමා ඔප්පු කර පෙන්වන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

එවැනි දෙයක් එහි නෑ.වෙන කොහේ හරි තිබිල.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. කුලරත්න මහතා

මෙය සභාවට සුදුසු තත්වයක් නෙවේ.පාර්ලිමේන්තුව වගේ අනවශ්‍ය ආදර්ශ දෙන්න එපා. මේ සභාවට අවශ්‍ය දේ කතා කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා</u>

මේක නතර කරන්න.අරගලය යනවා.එදා මටත් 9 දා කතාකලා යන්න.මට හිතුනේ නෑ.රැකියාවට ගියා.හැබැයි යන්න පුළුවන්. ඒක තමාගේ කැමැත්ත.පිකටිං. කැමැත්ත. මට කිසි අවුලක් උනේ නෑ.මම කාටත් එකයි.සුභදයි.මට කව්රුත් ගහන්න එන්නේ නෑ. ආවත් අරින්නෙත් නෑ.අපි ගමට වැඩ කල අය.අවු.15 ක් අපි වැඩ කලා.100 කලත් එකක් නොකලොත් බනිනවා.මේවා සාමාන්‍ය දේවල්.ප්‍රාෙද්ශිය සභාව ගිනි ගත්තා නම් ඉවරයි.ඒත් අපි 45 සුභදයි.ඒ සුභදකම ඉදිරියටත් රැකගන්න. අපි හිටියත් නැතත්.මිනිස්සුත් අපිව රැක්කා.කුරුවිට පොලිසිය හොඳයි.ස්ථානාධිපතිතුමා මට කෝල් කලා.මේගැන කිව්වා.අපි සෝමරත්න මන්ත්‍රීතුමා උපසභාපතිතුමා ,උයලා දුන්නේ.අනවශ්‍ය දේවල් ඕනි නෑ.ගම්මු විරුද්ධ හොරුන්ටයි.ගම්වල අය අපිව රැක්කා.පොලීසිය වගේම ගමේ ජනතාව අපිව රැක්කා.අපි දේශපාලනය පැත්තකටම දැම්මා.තාත්තා හිටියානම් මම අයින්වෙන්න රට යන්න කියලා.අපේ දරුවන්ට රටක් ඕනි.තනතුරු ඕනි නෑ වැඩකරන්න.නමුත් මේ ප්‍රශ්න කාටත් වෙන්න පුළුවන්.ඒ වගේම මේවිධිහට ප්‍රශ්න හදන් සිංහල ජාතිය වැනසෙන්න එපා.ජාතිය නැතිකරන්න එපා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා</u>

මට එදා යන්න බැරිඋනා.මම දැක්කා මාධ්‍යයන් රැස්වීම තිබුනා.පිරිසක් මේ කැඳවීම අනුමත කරන් නෑ.පුද්ගලිකව එදා එහෙම පිරිස කැඳවීම මමත් අනුමත කරන්නෑ.අපි මෙතෙක් තිබුන මැයි රැලි වලට ගියා.බස් අරන්.නමුත් මගදි වෙනදේ අපි දන්නවා.පදමට ගහලා.පාලනය කරන්නබෑ.මේක දන්න දෙයක්.යම් සිද්ධාන්ත මේකේ තරයේ ප්‍රතික්ෂේප කරනවා.තිරිසන් විධිහට මිනිස්සු මිනිස්සුන්ට ගැහුවා.ජේවීපීත් හිටියා එතන.මට ඔප්පු කරන්නබෑ. ඒ අයට පක්ෂ සාමාජිකත්වයක් දෙන්නේ නෑ.සජිත්ට ගැහුවා.අනුර කුමාරට මොකුත් නෑ.රටම ගිනි ගත්තා.රටේ නායකයා මේවට වගකියන්න ඕනි.මේ තත්වෙට.මර්ධනය කලා.සිල් අරන් කරන්නබෑ.රටේ නායකයාට ඕනි විධිහට රට පාලනය කරන්න ඕනි.නිලධාරින්ට ඕනි විධිහට බෑ.පොලිසියට බලය දිලා නෑ.වෙඩි තියන්න බලය දුන්නා නම් හරි.මේවා වෙලාවට ගන්න ඕනි තින්දු.පක්ස විපක්ෂ හැමෝටම නෙලුවා.නායක තින්දු හරි නෑ. මම පොහොට්ටුවේ.නමුත් අද වෙනතුරු ප්‍රාස විධිහට අපිව කැඳවලා නෑ.නායකයා ගමේ වෙන දේ දැනගන්න ඕනි.ගමේ හඬයි ගමේ මන්ත්‍රිගෙන් යන්නේ.ගමේ මන්ත්‍රි කියන දෙයක් ඇහුවේ නෑ.පිලිකුල ප්‍රකාශ කරනවා.මහින්ද ගරු හිටපු ජනපතිට ගරු කරනවා.කලින් ගියානම් නම්බුයි.නිදහසේ හුස්මක් මේ රටට වැටුනේ ඔහු නිසා.යුද්ධය නැති කලා.රට ඉදලා එන අය කියන්නේ මේ රට සුරපුරක් කියලා.එහෙම කලා.නමුත් පාර්ලිමේන්තුවේ 225 වග කියන්නම ඕනි.රජය වියත් මග ගියා.මේ සභාවේ කට්ටිය ගියානම් මීට හොඳයි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

මගේ යෝජනාවට විවිධ මත දැරුවා.නමුත් පොලිසිය මේගැන විශේෂ මැදිහත්විමක් කලා.මුරකාරයා දන්නෙත් නෑ.ඒවගේම වැරදිකාරයෝ දින කිපයක් තුල නිතිය හමුවට ගෙන

ආවා.ඒවගේම ගමේ මිනිස්සුටත් ස්තුති කලයුතුයි.මා වෙනුවෙනුත් මගේ ගම පෙනිහිටියා.රෑ ගල් ගැහුවේ ගමේ මිනිස්සු නෙමේ.වීඩියෝ තියෙනවා.මට තරම් කවදාවත් ජේස්බුක් මඩ ගහලා නෑ.බොතේජු මන්ත්‍රී කීව වගේ මට ස්තුතිකරන්න බෑ.
මම හැමෝටම ඇගිල්ල දික් කරන්නේ නෑ.ඉතිරි වෙන්නේ වෛරය විතරයි.නිතිය අනුව විසදේවි.මේ සිදුවීම දෙකක් අත්අඩංගුවට අරන්.මම බලන්න ගියේ නෑ.මේ අවස්ථාවේ නැවතත් කුරුවිට, ඇහැලියගොඩ,පොලිස් ස්ථානාධිපතිතුමා ඇතුළු කාර්ය මන්ඩලයට,කුරුවිට යුද හමුදා මුලස්ථානයට නිලදාරීන්ට ස්තුති කරනවා.

අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව පසුගිය සමයේ රටේ ඇතිවූ ගැටුම්කාරී තත්වය හමුවේ කුරුවිට ප්‍රාදේශිය සභාවට හා බල ප්‍රදේශයට මැනවින් ආරක්ෂාව සැපයූ කුරුවිට හා ඇහැලියගොඩ පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිතුමා ඇතුළු කාර්ය මන්ඩලයට,කුරුවිට යුද හමුදා මුලස්ථානයට නිලදාරීන්ට ස්තූතිය පිරිනැමීමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxxx**

**2022.06.10** දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක **05-03** උද්‍ෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

එස්. එච්.ආර්.වීරක්කොඩි,
ලේකම්,
ප්‍රාදේශිය සභාව,
කුරුවිට.

**<u>2022.06.10 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-04 උදෘතය</u>**

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**05-04.** **සභාව සතු එල්ලාවල පිටකන්ද මාර්ගයේ අනවසර දැව ප්‍රවාහනය නිසා සිදුවූ හානි වෙනුවෙන් තක්සේරු කර අයකරගැනීම් සිදුකිරිමට කටයුතු කිරිම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
**සභාව සතු එල්ලාවල පිටකන්ද මාර්ගයේ අනවසර දැව ප්‍රවාහනය නිසා සිදුවූ හානි වෙනුවෙන් තක්සේරු කර අයකරගැනීම් සිදුකිරිමට කටයුතු කිරිම ට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

**මම මේක වාචිකවත් දැනුම් දුන්නා.පොදුවේ ගත්තාම වානිජ ව්‍යාපාර කරන අය නිසා ප්‍රාදේශිය සභා පාරවල් හානිවෙලා.එල්ලාවල පිටකන්ද රබර් ඉඩම් තියෙනවා.විශාල ව්‍යාපාරික ඉඩම්. ගමේ අය හදපු මාර්ග.ග්‍රාම සංවර්ධන සමිතිය සම්බන්ධ වුනා.පස්සේ අපි ගැමිදිරිය ව්‍යාපෘතිය ඇරඹුවා.මේ පාරේ විහාල දැව ප්‍රවාහනය වෙනවා.පුද්ගලික ව්‍යාපාර කරන්නේ.පාර හාන් විම වෙනුවෙන් වහාම තක්සේරු කර මුදල අයකරගන්න.සභා ආදායමක්.අවසානයේ ගෙවන්න බෑ කියනවා.නීත්‍යානුකූල කරන්න.ගස් ගලවා විකුනනවා.පාර හානිය ලක්ස ගානක්.බලතල අනුව කටයුතු කරන්න.මේ ප්‍රශ්නය මේ තරම් දුර යායුතු නොවුනත් මේක දැන් ගමේ අයට වේදනාවක් වෙලා.ඒකය් මේ සභාවට යොමු කලේ.මේ පාර ආයේ ආයේ හදන්න බෑ.ගමේ මන්ත්‍රිට කියලා වැඩක් නෑ කියලා මිනිස්සු හිතන්නේ.ඒ නිසා මේ වෙනුවෙන් කටයුතු කරන්න.පාර කැඩුනොත් මුදල් වියදම් කරන්න වෙන්නේ සභාවට.නිලධාරියෙක් බලන්න යවන්න අමාරුද?නමුත් පස්සේ ගැටව වලට විසඳුම් හොයන්න වෙන්නේ මුදල් වියදම් කරලා.කාර්මික නිලධාරී ඇරලා ඇස්තමේන්තු මුදල සභාවේ තැන්පත් කරන්න කියන්න.බෑකියනවානම් අධිකරන ක්‍රියා මාර්ග ගන්න.නඩු ගාස්තු එක්ක ගන්න පුළුවන්.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා
උපසභාපති වෙලත් ඒ වැඩේ කරගන්න බැරිනම් මමත් මාස 6ක ඉදන් කියනවා වලදුරේ පාර ගමනැගුම පාරගැන.ඒ පාර ලොකු වාහන අනවසර ප්‍රවාහන නිසා කැඩිලා.ආන්ඩුව අහන්නෙත් නෑ.සභාව අහන්නෙත් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ධර්මදාස මහතා

අපේ පැත්තේ හයිටේෂන් ලයින් එකකට කියලා විශාල ගස් කපලා.පරිසර හානියක් විශාල.

දැන් යාබද හොරගස් කපනවා.නිලධාරින් කියනවා සීමා කියලා.මිනිසුස කියනවා අදාල නැ කියලා.පරික්ෂනයයක් කරන්න.

- ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

ගරු උප සභාපතිතුමා ගේ ගැටළුවට කාර්මික නිලධාරිනිය යැව්වා.නමුත් නමක් දැනගන්න බැරිවෙලා.ලිපිදැම්මම එයා නෙවේලූ.ආයේ යැව්වා.පොලිසි ගියා.නවත්වන්න කිවා. මම හිතුවේ නැවැත්තුවා කියලා.ආයේ අදිනවළු.කාර්මික නිලධාරි මේදැන් යැව්වා.නිති අනුව හානිය ලබා ගන්න ඕනි. ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා කියන වලදූර පාර.ටී.ඕ.බැලුවා.ඒත් මාස 6ක් කියලත් කෙරෙන්නැළු.අයිතිකරුවෙක්නෑ.ලිපිනයක්නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා
දැව සංස්ථාව කරන්නේ. පාර කැඩිලා.පොලිසියේ පැමිනිල්ල දාන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා

දැව සංස්ථාව සෙලාන් එක ලඟ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා

කොන්ත්‍රාත්එකක්.අනිවාර්යෙන්.කෙනෙකුට දිලා ඇති.නම ගම එපා. පොලිසියේ පැමිනිල්ලක් දාන්න.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

පැමිනිලි දාන්න.විත්තිකරු දැව සංස්ථව.ස්ථාන පරික්ෂාව කරයි.ලියුම් යවයි.මේ මුදල ගැනත් එදාට කියන්න.

- ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
දේවින්ද මන්ත්‍රී තුමා කියනවා දැව සංස්ථාව කියලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා

අපි පතලෙට දැව ගන්නවා.දැවසංස්ථාවේන චේන්දාලා අදින්නේ.දැන් ඉඩම ඉවර වෙන්න ගිහින්.මිනිස්සු 50 විතර එනවා.දැව සංස්ථාවේ අය ඉන්නවා.අපි පතල් වලට මුදල් දීලා ගන්නේ.අපි සභාව වෙනුවෙන් පෙනී සිටින්නම්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා</u>
පාරක දැව අදිනකොට පුද්ගලයාව දන්නැ කියන එක නිලධාරියෙක් විධිහට ප්‍රකාශ කිරීම සුදුසු නෑ.ඒ ඉඩමට හිමි කරුවෙක් ඉන්නවා.එවැනි අවස්ථාවක හිමිකරුට චෝදනා කරන්න.අපි සභවේ වෙලත් වැඩක්නෑ.වගකීම ගැන.දැව සංස්ථාවට විරුද්ධව දැම්මම නිවැරදි කෙනා එයි.ප්‍රවාහනයයි ගැටළුව.ඊගාවට කැලෑ කපන තැන හිමිකරු ඇති.රජයේ ඉඩමක් අයිති කාටද?

- <u>ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
කාර්මිකනිලධාරී මේ සියළු තොරතුරු ලබාගෙන ඉදිරි කටයුතු කරන්න.වාර්තා ගන්න. සභාව සතු එල්ලාවල පිටකන්ද මාර්ගයේ අනවසර දැව ප්‍රවාහනය නිසා සිදුවූ හානි වෙනුවෙන් තක්සේරු කර  අයකරගැනීම් සිදුකිරිමට කටයුතු කිරිම  සිදු කරන්න.

අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx<u> ගරු උප සභාපති  අනිල් ලියනගේ මහතා </u> විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව සභාව සතු එල්ලාවල පිටකන්ද මාර්ගයේ අනවසර දැව ප්‍රවාහනය නිසා සිදුවූ හානි වෙනුවෙන්  තක්සේරු කර  අයකරගැනීම් සිදුකිරිමට නිත්‍යානුකූලව කටයුතු කිරිම  ට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

2022.06.10 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-04 උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

එස්. එච්.ආර්.වීරක්කොඩි,
ලේකම්,
ප්‍රාදේශිය සභාව,
කුරුවිට.

**05-05.** ග්‍රාමීය ගෙවතු වගා වැඩසටහන සඳහා අවශ්‍ය තාක්ෂනික උපදෙස් හා කාබනික පොහොර නිෂ්පාදනය දිරිමත් කිරිමට අවශ්‍ය යෙදවුම් ලබාගැනීම සම්බන්ධ යෝජනාව.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

ග්‍රාමීය ගෙවතු වගා වැඩසටහන සඳහා අවශ්‍ය තාක්ෂනික උපදෙස් හා කාබනික පොහොර නිෂ්පාදනය දිරිමත් කිරිමට අවශ්‍ය යෙදවුම් ලබාගැනීමට අවශ්‍ය ආයතන සම්බන්ධකරවිමට මැදිහත්වීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

අපි බලප්‍රෙද්ශයේ කෘෂි කටයුතු නංවා සිටුවිම සඳහා කමිටුව මූලික සාකච්ඡා කලා.මේ යෝජනාව ඒ සඳහා වඩාත් ප්‍රගතියක් ලබා ගැනිමට රජයේ විවිධ ආයතන තියෙනවා. මැදිහත්විම් ලබාදෙන . ඒවා සම්බන්ධ කරගැනිම අපි හරහා කරගත හැකියි.මේ තියෙන අර්බුධ ඉවත ලා අපි රට වෙනුවෙන් යමක් කල යුතුයි.

ක්‍රම වේද හදමු.ආයතන සම්බන්ධීකරනයක් අවශ්‍යයි.සමහරු එන්න කිවට එන්නේ නෑ.නමුත් ඒක ඒ අයගේ ඩියුටියක්.එමනිසා බල ප්‍රේද්ශය තුල වගා කලාපයක් කරන්න.ආයතන සම්බන්ධිකරනය හා තාක්ෂන අපදෙස් ලබාගැනිමට අපි සහාය වෙමු.පෝර හදන්න ඕනි.යූරියා ගන්න මුදල් ඕනි.නමුත් විශාල කුකුල් ගොවිපලක් දෙහෙරගොඩ තියෙනවා.යෙදවුම් ගන්න පුළුවන්.තවත් දේශපාලනික සමදතා අනුව ඉල්ලිම් කල හැකියි.ගොවිජන දෙපාරතමේන්තුව කෘෂි හා ධිවර අමාත්‍යංශය,අපනයන දෙපාර්තමේන්තුව ආදිය මේ කලාපය සංවර්ධනට දායක කරගත හැකියි.ප්‍රතිලාභින් 100 ක් වත් නිෂ්පාදනයට සාපුවම දායක කරගෙන මේ ආයතන සම්බන්ධ කොටගෙන සහාය ලබා දෙමු.මේක සම්බන්ධීකරන කමිටුවේත් යෝජනා කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

ගිය සභාවේත් කතා කලා.මමත් මගේ කොට්ඨාශයේ වසර ගානක් පුරන් වි තිබූ කුඹුරු අස්වැද්දුවා.ගොවියෝ එක්ක.රජයේ නිලධාරීන් උනන්දු වූ අයත් ඉන්නවා. නැති අයත් ඉන්නවා. එදා කමිටුව හැදුවා.අද පුරන් කුඹුරු ප්‍රශ්න ගොඩයි.ඉඩම් ටික බෙදලා වැඩ කරනවා.හෙට එලවළු පැල දෙනවා.මේක හොඳ වැඩක්.දැන් හාල් ගැටළුව ආවා. හාල් නෑ.ගිනි ගනන්.තියෙන අයට පුළුවන්.එදා වේල අයට මොකුත් නෑ.සේරම මාපියා. හාල්, සබන්, ගිනිපෙට්ටියේ ඉදන් මාපියා. අපි සද්භාවයෙන් යම් මුදලක් කොට්ඨාශ 26 ට පෝෂනය කරන්න දායකවෙන්න සභාවෙන් දිය යුතුයි.එළවළු, පරිප්පු අපිට ආහාර ගැටළුවක්.මේ සියල් කලමනාකරනයේ ප්‍රබල දුර්වලතා.දිපු බීජ පැලවෙන්නෑ.අනික ඒවා පැලවෙන කාල තියෙනවා.මේ කලෙට වැස්සේ බෑ.මිරිස් කුනු වෙනවා.අනික පෝර. මම සමන් දේවාලෙදි ගරු ජනාධිපතිතුමාව ඒ ගැන කිව්වා.ඒවා අහන්නෑ. අන්තිමට රටටම වැරදුනා.අන්තිමට අපිම අමාරුවේ. අදර්ශ වැඩ තියෙන්න ඕනි.ළමයි ලඟ පාසැලට දාන්න ඕනි.රජයේ සේවකයන්ලඟ ගමේ ආයතනයට දාන්න ඕනි. නය අරන් කාල කාලා හොරු අල්ලනවා.
සභාවේ ගෝෂා..

කෝවිඩ් ආවා.අල බතල හිටවන වැඩ කලෝත් හරියයි.අපි ආදර්ශ දෙන්න ඕනි.ලංකාවේ ප්‍රථම ආදර්ශ කටයුත්ත කුරුවිටින් කරමු..විදේශ රටවලිනුත් උදව් දෙයි.සංවිධාන වලින් උදව් කරයි.

අපි එකතු වෙලා වැඩ කරමු. නැත්නම් හිනාවෙන්න බැරිවෙයි.අඩන්න වෙන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා</u>
ගියවර සභාවේ කතා කල පරිදි අපි රැස්වුනා.පවුල් 100 හැම කොට්ඨාශයකින්ම තෝරලා දේශපාලන බේද නැතිව වගා කටයුතු වලට සභා ය දෙන්න කතා කලා.ආදර්ශ ගෙවතු.පැල දීම ද්‍රව්‍ය දිම.රසායනික පෝර මිල අධිකයි.ප්‍රායෝගික නෑ.සමෘර්ධි යෙන් පැල දුන්නට ඒවා නිවැරදි ක්‍රමවේද යටතේ ක්‍රමවේද යටතේ ජනතාවට දැනුවත්කර පසුවිපරම්කර සාර්ථක වගා බවට පත්කිරිම සිදුවි නෑ.

මෙහිදි ගරු මන්ත්‍රිතුමන් විසින් දිර්ඝ ලෙස කෘෂි භෝග වගාව පිලිබඳ සභාව දැනුවත්කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා

වවාගෙන කමු.මෙය මේවෙනකොට මෙතන කලාට ප්‍රායෝගිකද?ජනතාවට පුළුවන්ද මේ වෙලාවේ මේවාට සහභාගි වෙන්න. එහි ඵලය කුමක්ද?හැමතැනම පෝලිම්.ඇට පැල දිලා විශාල මුදලක් අපතේ.සභාවෙන් මුදල් දුන්නොත් ඒවත් අපතේ යයිත ඒනිසා ජනතා මුදල් අපතේ නොයවා ඉතාමත් ප්‍රෙව්ශමින් පරිහරනය කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ.කුලරත්න මහතා

මේ කටයුත්ත සාර්ථකව කරන්න. නිවැරදි සහාය සියළු ආයතන වලින් ගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා

මේවාට සභාවේ ඉන්න කම්කරු සර්ලාව දාන්න.වැඩ ගන්න.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

සෑම තැනම වගාවලට වන සතුන්ගෙන් වගාවලට හානි.ඌරෝ, ඉත්තෑවෝ වගේ.ඒවාට පිලියම් ඕනි.මෙය ගොවියාට විශාල ගැටළුවක්.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

ඒවගේම මේකාලේ අපතේ යන කොස් දෙල් හැමතැනම. ඒවායින් විශාල ආදායමක් ලබාගත හැකියි.විදාතා ආයතනයේ කොස් වියලන යන්ත්‍රයෙන් ඉතාමත් සීමිත පිරිසක් වැඩ ගන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා

සමෘර්ධි පැල දුන්නා. ඉදිරියටත් ගොවියාට උදව් කරනවා.සියල්ල අසාර්ථක නෑ. සමහර නිලධාරින් ඒවා පසු විපරම් කලේ නෑ.පාඩු අයකරගත යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී යුරේශ් චන්දිම මහතා

දිගෝගෙදර ටෙක් එක වහලා. ඒ ඉඩම නිකම්ම තියෙනවා. සභාවට පවරාගෙන වගා කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා
සමහර නිලධාරින් පවා පෝර ආදිය යොදන ක්‍රම දන්නේ නෑ.ගොවිතැන ගැන දන්නේ නෑ.රත්නපුර කෘෂි කාර්යාලයෙන් උපදෙස් දෙනවා. නිසි ලෙස. ඉහල තාක්ෂන උපදෙස් දෙනවා කාංචන මහතාව මේවාට යොමුකරගන්න.සාර්ථක කරගන්න පුළුවන්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්ප සූරිය මහතා</u>

**මේ වෙලාවේ ගෙවතු වගාව අත්හැරලා බෑ.නිසි සම්පත් දායකයින් උපදෙස් අරන් 16 දින කටයුත්ත හෝ සාර්ථක කරගමු.ප්‍රවීනයන් රටට මේතත්වය වන බව කිවත් රජය පිලිගත්තේ නෑ. පසුගිය සියල්ල අසාර්ථක උනත් අපි මේ වගා කිරිම හෝ දැන් ඵලදායි ලෙස කරමු.පැරනි ගොවිතැන් ක්‍රමවේද ත් උපයෝගි කරගමු.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා</u>

**රජයේ ඉඩම් වවන්න දෙන්න කිවත් නිලධාරින් විරුද්ධ වෙන්නේ.ප්‍රාෙද්ශිය ලේකම් කාර්යාලයේ පිටිපස ඉඩම නිකම්.උඩකඩ ග්‍රාමීය රෝහල ඉඩම ,ඒවගේ ඉඩම් වල වගා පටන් ගමු.**

<u>ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**ආයතන වල ඉඩම් තිබුනාට එසේ දෙන්නේ නෑ.ඉල්ලිම් කරමු ගොවිසංවිධාන වලට දෙන්න කියලා වවන්න.අපි 16 දාට මේ කටයුත්ත හොඳින් කරමු. එදාට සියළු දෙනා එන්න.**

අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx <u>ගරු උප සභාපති  අනිල් ලියනගේ මහතා </u> විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව ග්‍රාමීය ගෙවතු වගා වැඩසටහන සඳහා අවශ්‍ය තාක්ෂනික උපදෙස් හා කාබනික පොහොර නිෂ්පාදනය දිරිමත් කිරිමට අවශ්‍ය යෙදවුම් ලබාගැනීමට අවශ්‍ය ආයතන සම්බන්ධකරවිමට මැදිහත්වීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ආර්.සෝමරත්න  මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**05-06.**කුරුවිට මහජන වැසිකිලිය ඉදිකිරිමට පළාත් සභාවෙන්,මධ්‍යම ආණ්ඩුවෙන්  මුදල් ලබාදෙන බව දන්වා සිටියද මෙතෙක් ක්‍රියාත්මක නොවූ නිසා සභා අරමුදලෙන් ඉදිකිරිමට සභා අනුමැතිය ල ගැනීමේ යෝජනාව.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ආර්.සෝමරත්න  මහතා</u>

කුරුවිට මහජන වැසිකිලිය ඉදිකිරිමට පළාත් සභාවෙන්,මධ්‍යම ආණ්ඩුවෙන්  මුදල් ලබාදෙන බව දන්වා සිටියද මෙතෙක් ක්‍රියාත්මක නොවූ නිසා සභා අරමුදලෙන් ඉදිකිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා

**මා දීර්ඝ දේශපාලන ගමනකට ජනතා වරම් ලැබූ අයෙක් උනත් මා හට නගරේ මන්ත්‍රී ලෙස නගරේ වැසිකිලිය තාම බැරිඋනා හදාගන්න.21 සියවසට ගැලපෙන නවින පහසුකම් එහි නෑ. මට ඉතාමත් කනගාටුයි.ලැජ්ජයි.මේ වැසිකිලිය ගඳයි. විශාල මුදලක් වැය කර බයෝ සෙල් එක හැදුවත් පලාතේ ඉන්න බැ ගඳයි.ඒක කිව්වා කියලා කාර්මිකනිලධාරි මට අභියෝග කලා.තාම කිසිදු පරික්ෂනයක් කලේ නෑ.ඕනිත් නෑ.මම මේ ඉල්ලා සිටින්නේ ජනතාව වෙනුවෙන් මේ වැසිකිලිය කෙහෙන්හෝ තියෙන මුදලක් අරන් මේක හදන්න.මා යන්න පෙර මේ වැසිකිලිය හදන්න.ඉල්ලා සිටින්නේ එයයි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයි.කේ. කුලරත්න මහතා

**රත්නපුර නගර සභාවේ වැසිකිලිය ආදර්ශයට ගන්න. අඹගහයට එක.ඒවා බලාගන්න ඉතාමත් සුදුසු අයට දිලා.සුපිරි තත්වයේ තියෙනවා.බලන්න .මේවාට ආධාර ගන්න ලිපි ලිවාට මදි. කොළඹ ගිහින් ඉල්ලන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා

**සියල්ල නිමවෙමින් තිබුනේ. සියල්ල අනුමත කරලා මේ දේශපාලන වෙනස්වීම මත ප්‍රමාද උනේ.වාර්ෂික ව්‍යාපාති අනුමත කිරිම් හරහා හෝ ප්‍රතිපාදන ලබාගමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා

**කිරිඇල්ල වැසිකිලියට බාලගිරි දෝසේ.ජනතාවට යන්න තැනක් නෑ.තව ටික දිනකින් මේක විසුරවාවි.කිරිඇල්ල වැසිකිලිය කටයුතු කඩිනම් කරන්න.මුදල් වෙන්කල ඒවට ඒ සල්ලි දෙන්න. අරමුදල් එක කටයුත්තකට විතරක් යොදවන්න එපා.**

**සභාවේ ගෝෂා.....**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**සභාවේ නිශ්ශබ්දතාවය රකින්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා

**සල්ලි නැත්නම් මුදල් අරන් දෙන්නම්. රෝහිත මහත්තයා කැමතියි.වැඩේ කර දෙයි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**අපි ඒ ඉල්ලීම කරමු.වැසිකිලිය ගඳ ගහනකොට නිති විතරක් වැඩක් නෑ.අවශ්‍ය අනුමැතියක් අරන් ඒ වැඩේ කරමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා

**මමත් යම් දායකත්වයක් අරන් දෙන්නම්.ශ්‍රමය හා යම් පරිත්‍යාගයක් අරන් දෙන්න පුළුවන්.මමත් මැදිහත්වෙන්නම්.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

**මම තාවකාලිකව හදා දෙන්න එදා ඉල්ලුවා. දුන්නෑ.ඉතා සුළු වියදමක් දරා හදාගන්න තිබුනා. අවසර දුන්නේ නෑ.අද ලොකු ගැටළුවක් වෙලා.බයෝසෙල් හරියන්නැ කියලා මම නිවා.බයෝ සෙල් දාන්න පිරිසුදු කරන විට.කෙසේ වුවත් මෙය හදමු. මාත් සහාය වෙන්නම් අද නම් ලක්ෂයක් විතර වියදම යයි.එදා රු. 25000 න් කරන්න තිබුනා මෙක.**

- ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**අපි මේකට බොහෝ උත්සහා කලා.ආධාර ප්‍රතිපාදන ඉල්ලුවා. නමුත් වැඩේ කෙරුනේ නෑ.**

**අපි ප්‍රතිපාදන තියෙන විධිහට සභා අරමුදලෙන් හෝ මේ කටයුත්ත කරමු. එසේම අසංක මන්ත්‍රී කිව ලෙස අර ලිපියක් හදාගෙන රෝහිත මහතා හමුවෙමු.රත්නපුර නගර සභා වැසිකිලිය ත් ආදර්ශ ලෙස බලමු.ලේකම්තුමිය අර ලිපිය කටයුත්ත කරන්න. අවශ්‍ය අවසරයක් තියේනම් ඒවත් ගමු.**

අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා අනුව කුරුවිට මහජන වැසිකිලිය ඉදිකිරිමට පළාත් සභාවෙන්,මධ්‍යම ආණ්ඩුවෙන් මුදල් ලබාදෙන බව දන්වා සිටියද මෙතෙක් ක්‍රියාත්මක නොවූ නිසා සභා අරමුදලෙන් ඉදිකිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**05-07.**පත්බේරිය කොට්ඨාශයේ සබරගමුව පළාත් සභාවෙන් ක්‍රියාත්මක කරන ලද ආක්ටික් ගම්මාන වැඩසටහන යටතේ කරන ලද කර්මාන්තවල කුරුවිට ප්‍රාදේශීය සභාව සමග ගිවිසුම්ගත කර්මාන්තවල මුදල් කුරුවිට ප්‍රාදේශිය සභාව මගින් ගෙවීම් කර පසුව සබරගමුව පලාත් සභාව මගින් ප්‍රතිපූර්නය කිරිම සම්බන්ධ යෝජනාව.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

පත්බේරිය කොට්ඨාශයේ සබරගමුව පළාත් සභාවෙන් ක්‍රියාත්මක කරන ලද ආක්ටික් ගම්මාන වැඩසටහන යටතේ කරන ලද කර්මාන්තවල කුරුවිට ප්‍රාදේශීය සභාව සමග ගිවිසුම්ගත කර්මාන්තවල මුදල් කුරුවිට ප්‍රාදේශිය සභාව මගින් ගෙවීම් කර පසුව සබරගමුව පලාත් සභාව මගින් ප්‍රතිපූර්නය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා

විශාල ව්‍යපෘති ගනනක් තියෙනවා. සබරගමු අරුනළු වැඩසටහන යටතේත් කර්මාන්ත 5ක් නිම කලා.ඒත් බිල් ඉදිරිපත්කලත් තාම ගෙව්මිනෑ.ඒ නිසා පත්බේරිය කොට්ඨාශයේ සබරගමුව පළාත් සභාවෙන් ක්‍රියාත්මක කරන ලද ආක්ටික් ගම්මාන වැඩසටහන යටතේ කරන ලද කර්මාන්තවල කුරුවිට ප්‍රාදේශීය සභාව සමග ගිවිසුම්ගත කර්මාන්තවල මුදල් කුරුවිට ප්‍රාදේශිය සභාව මගින් ගෙවීම් කර පසුව සබරගමුව පලාත් සභාව මගින් ප්‍රතිපූර්නය කරන්න.ජනතාව දැඩි අපහසුතාවයේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

ගිය සභාවේත් කිවා.සියයට 50ක් ගෙවන්න.මතක් කිරිම් ගහන්න. නැවත ්සිහි කැදවන්න මේ ගෙව්ම් ගැන.මේ මිනිස්සු දැඩි අපහසුතාවයේ.

- ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

දැනට මුදල් නෑ.ඒනිසා නැවත සිහිකැඳව්ම් කරමු.ප්‍රතිපාදන ලැබෙන මේ පිලිබඳ සලකා බලමු.

අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා අනුව පත්බේරිය කොට්ඨාශයේ සබරගමුව පළාත් සභාවෙන් ක්‍රියාත්මක කරන ලද ආක්ටික් ගම්මාන වැඩසටහන යටතේ කරන ලද කර්මාන්තවල කුරුවිට ප්‍රාදේශීය සභාව සමග ගිවිසුම්ගත කර්මාන්තවල මුදල් කුරුවිට ප්‍රාදේශිය සභාව මගින් ගෙවීම් කර පසුව සබරගමුව පලාත් සභාව මගින් ප්‍රතිපූර්නය කිරිම සම්බන්ධ ඉදිරියේදී ප්‍රතිපාදන ලැබෙන අයුරින් සලකා බැලිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-08. පත්බේරිය කොට්ඨාශය තුල ඩෙංගු මර්ධන වැඩසටයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ යෝජනාව.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා**

**පත්බේරිය කොට්ඨාශය තුල ඩෙංගු මර්ධන වැඩසටයන් ක්‍රියාත්මක කිරීම ට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා**

**මෙය ක්‍රියාත්මක කිරිම අත්‍යවශ්‍යයි.කොරෝනා නිම වීමත්සමග ඩෙංගු.අදත් හට් ගහලා කසල රැස් කරනවා.ඒවා ගිහින් දාන්න නිසි ලෙස වාහන යොදවන්න.මගේ වියදමෙන් අත් පත්‍රිකා ගැහුවා.මේ ටික ශ්‍රම බලකාය දාලා බෙදවමු.**

**- ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**ජීයදුරු සංගමය හරහා ප්‍රචාරය කරවන්න.කන්ඩායමක් ශ්‍රමදානයට එවන්නම්.ජලය රැදෙනෙ ඒවා කසල විතරක් ගන්න.**

අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා අනුව පත්බේරිය කොට්ඨාශය තුල ඩෙංගු මර්ධන වැඩසටයන් ක්‍රියාත්මක කිරීම ට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන අනෙකුත් යෝජනා.**

**2022.06.10 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-09 උද්‍ධෘතය**

**05-09. කුරුවිට ප්‍රාදේශිය  සභා වෙළඳ සංකීර්ණයේ ඉහල මහලේ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරිම 02 අධියර ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ ස්ථාවර තැන්පතු මුදලින් ගෙවීම් කිරිමට සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව.**

- ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා

**කුරුවිට ප්‍රාදේශිය  සභා වෙළඳ සංකීර්ණයේ ඉහල මහලේ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරිම 02 අධියර ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ ස්ථාවර තැන්පතු මුදලින් ගෙවීම් කිරිම සම්බන්ධවයි.මෙම ව්‍යාපෘතියේ මුළු වටිනාකම රු.1650730.52 යි.2021 වර්ෂයේ පුවත්පත්වලපල කරලා නීත්‍යානුකූලව ගිවිසුම්ගතව සිදුකලා.ව්‍යාපෘතියේ ඉදිකිරිම්වලට අදාල පලමු කොටස්බිල ඉදිරිපත්කර ඇත.එහි වටිනාකම රු.3738268.80 කි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-

**ඉල්ලන මුදල කීයද?**

- ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා

**රු.එක්කෝටි හතලිස් හයලක්ෂ හැට එක්දාස් එකසිය අසූ එකයි ශත අසූ හයක්.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-

**මුළු මුදල කීයද?**

- ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා

**එක්කෝටි අසූපන්ලක්ෂ අසූහතරදාස් ගානක්**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා :-

**ඒ මුදලෙන් සම්මන්ත්‍රන ශාලාව ප්‍රයෝජනයට ගතහැකි ලෙස සැකසියහැකිද?ආයේ බිල් නැත්ද?ඉදිකිරිම් නිසි ප්‍රමිතියට තියේද?ආයේ ඉදිකිරිම් නැත්ද?මහජන සේවය හා ඉපැයීමට දෙන්න පුළුවන්ද?**

- ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා

අවශ්‍ය උපකරන ආදිය මිලදී ගත යුතුයි.එසේම නොවැම්බර් මසට ඉදිකිරීම් ඉවරවෙනවා. ලිප්ට් එක ඇර.සියළුම බාත්රූම් සෝපානය ඇර එම කටයුතු ආරම්භ කල හැකි තත්වයේ තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-

පසුගිය අවස්ථා කිපයකදි අපි මුදල් වෙන්කලා.මේ ව්‍යාපෘතියට පරිපූරක ලෙස මුදල් ගත්තා.අද තත්වය අනුව තීරන ගතයුතුයි ස්ථාවර තැන්පතුවෙන් මුදල් ගැනීම පිලිබඳව.සභා ගිනුමට එකතුවෙන්න මුදල් ඇවිත් නෑ.අපේ සංවර්දන ව්‍යාපෘති ගනනක් සිදු කරන්නත් බැරිඋනා.මේ මුදල මේ ව්‍යාපෘතියට දුන්නොත් වෙනත් මුදල් නෑ.ස්ථාවර තැන්පතුවත් නෑ.ලැබෙන නිශ්චිත මුදලක් ගැන කියන්න බෑ.අපේක්ෂිත ආදායම් ඉලක්ක නෑ.මේක ගෙවලා සභාවේ සල්ලිත් හිඳුනොත් මේ මාසේ හෝ මේ සභාවත් විසිරෙව්වොත් අපි සභාව බංකොලොත් කරලා යන පිරිසක් බවට පත්වෙනවා.සභා ලේකම් කියන්න ඕනි සභාවේ මාසික වියදම.පඩිගෙවන්න හෙම වෙනත් විකල්ප තියේද? ගිනුම් කරනය පිලිබඳ ලොක්ු අවබෝධයක් නෑ.අපි මේවට අත උස්සලා බංකොලොත් උනොත් අපිටත් ගැටළු.උසාවි දඩ තියේනම් කඩිනමින් ගන්න.ගම්වල ඉන්න ජනතාවට ගැටළු.කර්මාන්ත කරපු අයට.බුද්ධියෙන් මේක විසඳන්න.45 ටම ඇහුම්කන්දෙන්න.ලඟ තියෙන මුදලක් දීලා නැති මුදලක් ගැන කීම යථාර්තවාදීද? අපේ පුද්ගලික මුදලක් නෙවේ මේ.සභාව පවත්වාගෙන යන්න ඕනි.පළාත් සබාව එක්ක කතා කරලා උසාවි දඩ මුදල් ගන්න. අතිකාල දීමේදි හොඳින් සොයාබලන්න.වෙනත් ගමන් වියදම් අඩුකරන්න.ස්ථාවර තැන්පතුව ගන්න දැන්ම ඉක්මන් වෙන්න එපා.

- ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

ස්ථාවර තැන්පතුව ගන්න එපාද? වැඩකරන්න එපා කියලා නෑ.වැඩ ඉවර වුනාම මුදල් නොදී ඉන්න බෑ.උප සභාපතිතුමා එකඟ නෑ. එතුමා පසුගිය වසරේ ලක්ෂ 20 ක වැඩ කරලා.බංකොලොත් කලා කියන්නේ කොහොමද?සම්මන්ත්‍රන ශාලාව සභාවේ වැඩක්.සියළු දෙනා කතා කලා.ස්ථාවර තැන්පතුවෙන් දෙන්න කියලා.කිරිඇල්ල වෙන්දේසි කරලා දෙමු කීවා.ප්‍රශ්නය කොන්ත්‍රාත් කරුට මුදල් දෙන්න බැරිනම් ගැටළුවක්.සම්මන්ත්‍රනශාලාව වැඩ නිම කලොත් අපිට ආදායම් එනවා.ගිවිසුම් අත්සන් කරලා මුදල් නොදී සිටීම ප්‍රතිපලය කුමක්ද?දෙකෝටි ගානක් එන්න තියෙනවා.ඒක ස්ථාවර තැන්පතුවේ දාමු.වැසිකිලියත් හදමු.පත්තරෙත් දාලා මේක කලේ.බැඳිලා ඉන්නේ මම.වගකියන්නේ කව්ද?එන ගාන තැන්පතු කරමු.මේ වෙන කොට වැඩ නොකල අයත් ඉන්නවා.මේනේ මුදල් නොදුන්නොත් පලය කුමක්ද?කොටස් බිලක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා :-

මුළු මුදලෙන් 50% දුන්නොත් බැරිද? මුලින්?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා :-

අපිට කෝටි 2 ක් ආවත් වැඩ කරන්න බැනේ.රජයේ මේ වෙලාවේ මුදල් වියදම් බැනේ.ගිවිසුම් ගතව ග්‍රාම සංවර්ධන සමිතිවල ලක්ෂ 10 ට ගිවිසුම් අත්සන් කරලා.අන්තිමට සිමෙන්ති මිල ඉහල ගිහින්.අපි ඉල්ලුම් කලා ඒ මුදල ඇතුලේ සංශෝධනය කරලා කරන්න දෙන්න කියලා.සභාවෙන් ලිපියක් එවලා වැඩකරන්න බෑ කියලා.

- ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

ඒ මුදල ඇතුලේ සංශෝධනය කරලා කරන්න පුවවන්.බෑ කියලා ලිපි අරින්න බෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා :-

සභා සල්ලි සභා කර්මාන්ත වලට වියදම් කරන්න බෑ කියලා තියෙන්නේ.නවත්වන්න කීවම කොන්ත්‍රාත්කරුව දැනුවත් කලා.මගේ කීමටයි පටන්ගත්තේ.මම කීවා ගිය මුදල බාගයක් මම දෙන්නම්.අත්අරිමු කීවා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-

මේ තත්වය අනුව මැද ඉඳගෙනයි උත්තර හොයන්න වෙන්නේ.ස්ථාවර තැන්පතුව පූර්න ලෙස මේ ගෙවීමට වියදම් කලාම අපිට මුදල් නෑ.ඒක ගෙවන්නැතිවත් බෑ. සාධාරන විධිහක් බලමු.මුද්දර ගාස්තු වලින් අපිට වැඩ කරන්න පුළුවන් නම් අපිට සති දෙකයි අරමුදල් එන්න යන්නේ.ඉවසගෙන ඉඳලා ඒ මුද්දර ගාස්තු වලින් මුදල් ගෙවමු.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

මාවයි මෙම තත්වයෙන් අපහසුතාවට පත්වෙන්නේ.ආන්ඩුකාරතුමාගේ අනුමැතිය ගමු.චක්‍රලේඛනයේ ප්‍රාදේශිද්ශීය සභාවට වැඩකරන්න එපා කියලා තියෙනවද?මතය විමසන්න සිදුවේවි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා :-

මේ ගෙවීම සිදුනොකරත් බෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා :-

ගිවිසුම අත්සන් කර ඇති අඩක් නිමකල වැඩ වලට මේ චක්‍රෙල්ඛය අදාල නෑ. ගිවිසුම අත්සන් කර වැඩ පටන් අරන් නැත්නම් අදාලයි.මේ ගෙවීමට බාධාවක් නෑ. වැඩ කිරීම නෙමේ ගැටළුව.සභාවේ දැන් තත්වය දෙස බලන පිරිස වැඩියි.අපි වසරකට පෙර වැඩ කරනකොට තත්වය වෙනස්. අපේ ආදායම් තත්වය පවත්වාගෙන යාමට බාධා ඇති උනොත් තත්වය ප්‍රබල වෙනවා. එසේම කෝටි දෙකක මුදලක් තව දින 14 කින් ලැබෙනවානම් මේ කෝටි දෙක අරන් ගැටළු විසඳිය හැකියි. පක්ෂ විපක්ෂ බේදයකින් තොරව මේ ස්ථිර තැන්පතුව ගත්තොත් පොහොට්ටුව මේ කුරුවිට ප්‍රාෙද්ශීය සභාව අවසන් කලා කියන මතය යා හැකියි. සභාවත් රැකගෙන මේ ගැටළුව විසඳන්න.සභාපතිතුමා සමග කතා කරන්නේ කොන්ත්‍රාත් කරු.පුද්ගලික ආයතනයක් නම් චෙක් එකේ පොටෝ කොපියක්

පෙන්නුවාමයි වැඩ කරන්නේ. එහෙම තත්වයක රජයේ ආයතන ෂුවර් නෑ.ගැටළුව අවබෝධ කරගන්න.අපේ ගෞරවයත් රකින්න.හැකිනම් මේ දින 14 තුල අතිරේක පිරිසක් දමලා ආදායම් රැස් කරලා තුලනය කරන්න. මේ අවස්ථාවේ ඉතා වැදගත්.

<u>ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

<u>මේ</u> සම්මන්ත්‍රණ ශාලාව වැඩ නිම කරනවට එකඟද?නැත්ද?අපේ මන්ත්‍රීතුමන්ලාට වැඩ කරන්න පුළුවන් වෙන්නේ නෑ ස්ථිර තැන්පතුව ඉතිරි කලාට.මුද්දර ගාස්තු ආවොත් හරි.මේ යෝජනාවට එකඟද? නැත්ද?

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>

ගියවසරේ නය හිමි දාලාද?නය හිමි ලේඛනයට දැම්මේ නැත්තේ ඇයි.

<u>ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

ඔබතුමා ලක්ෂ 26 ක වැඩ කලේ ඒ මුදලින් තමා.මට කැමැත්ත අකැමැත්ත දෙන්න.
මේ අවස්ථාවේ සභාවේ ගෝෂා පැවතිනි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-</u>

එහෙම බෑ.කරුනු කතා කරලා ජන්දය නිසි ලෙස විමසන්න.පක්ෂ විරුද්ධ ඇයි කියලා කරුනු කියන්න ඕනි.යථාර්ථය දැනගන්න.මටත් මේක ගැටළුවක්.මේ කරුමාන්තය වැදගත්.ඒත් අපි සතුව තියෙන එකම මුදලත් මේක.එයා යයි. නමුත් අපිටයි ගැටළුව.මේ මුදල ගැන අපි සියළු දෙනා උත්තර දෙන්න වෙයි.සාකච්ජා කරන්න.විශාල ප්‍රශ්නයකට මූන දෙන්න වෙයි.අපි ගැන හිතලා විශ්වාස කරලා සති දෙකක් ඉවසන්න කියන්න.දින 14 ඉදියි.අනිවාර්යෙන් ගෙවමු.නමුත් මේ ස්ථාවර තැන්පතුවෙන් ගෙවනවට මාත් අකැමැතියි.මේක ජනතා ආයතනයක්.අපිට චෝදනා එයි. ස්ථාවර තැන්පතුවෙන් මුදල් ගෙවනවට මාත් විරුද්ධයි.අසාර්ථක තීරන ගන්න එපා.ජනතා ආයතනය අපිට දුන්නේ තාවකාලිකව.වැඩ කරන්න.අපිට චෝදනා කරයි.මා මෙයට එකඟ නැත.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස්  මහතා :-</u>

අයවැය අතුරු අයවැය ආදිය හදලා මුදල් වෙන් කලා.ඒ කාලේ තැන්පතුවෙන් අරන් මේ කටයුත්ත කරන්න කීවා.ගිනුම අවසන් කරනකොට නයහිමි දාලියි අවසන් කරන්න ඕනි.මූල ධර්ම උල්ලංගනය කරලා.ගැටළුවක්.මේ රටේ චක්‍රෙල්ක වෙනස්වෙන විධිහට.මේ ආදායම රජයට ඉල්ලුවොත්.තව සති දෙකයි.සභා අරමුදලෙන් යම් ප්‍රමානයක් ගෙවන්න පුළුවන්.නමුත් සේවකයන් ඉන්නවා අනියම්.17ක්.ඒ අරමුදලට ගෙවන්න ඕනි.කසල අදින අය. මේ සේරමත් එක්ක සති දෙක ඉවසමු.ආවාම ගෙවමු.තෙල් ගැටළු. ඉන්ධන සීමා කරමු.මම මේ ස්ථාවර තැන්පතුවෙන් මුදල් ගෙවනවට විරුද්ධයි.එන හැටියට ගෙවමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා :-</u>

විපක්ෂයක් ලෙස අපි නිතරම සහාය දුන්නා.අද ගැටළුවක්.අවධානම පඩි ගෙවන්න තියෙනවා.සති දෙකෙන් ඒ මුදල් නාවොත් අපිට පඩි ආදී කටයුතු වලට මුදල්

තියේද?අනිවාර්යෙන් එයි කියන විශ්වාසය තියේද?මට දැනෙනවා. ස්ථිර නෑ.දීප්ති මන්ත්‍රී තුමා වැඩ මග නවත්වලා.තව තියෙනවා.අරමුදල් නාවොත් අපි සභාව කාබාසිනියා කලා කියයි. 44වම බනී.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

සති දෙකෙන් නාවා කියමු.ගෙවන්නේ කොහොමද?වැඩ කරලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් ජයරත්න මහතා :-</u>

ටික ටික ගෙවමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා :-</u>

අපි නම් ලක්ෂ 5 ක විතරයි කලේ.මෙතන සමහරු ලක්ෂ 25,30 කරලා.මෙනේරි පිටියත් ලස්සනයි.උපසභාපතිතුමත් වැඩ කරලා.කෝටි ගානක් තිබුන ගිනුම දැන් හිඳිලා.සමිතිවලට මුදල් ගෙවන්නත් අමාරුයි.අපි මුදල් සේරම වැය කරලා.සංවර්ධනයට.වීදිපහන් කවදා හයි කරන්නද?ගහයි මිනිස්සු.අද රට විසුරවයිද දන්නේ නෑ.කොමසාරිස් පාලනයට හරි යයි. ඒත් මේ මුදල් තියෙන්න ඕනි.45 ම මේක කැවා කියයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා :-</u>

අපි වැඩ කරලාම නෑ.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

කීප දෙනෙක් වැඩ කලා.ඒ මුදල් දෙනවා. එපා නම් නොගෙන ඉමු.සති දෙකෙන් මේ මුදල් නාවොත් මොකද කරන්නේ.ටිකක් ගෙවමු. සති දෙකෙන් ඉතිරි ටික ගෙවමු.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

අපේ පාර්ලිමේන්තුවට උනදේ දැක්කනේ.චක්‍ර ලේඛ අභිබවා අපිට යන්න බෑ. වැලිපාරත් කාපට් කලත් තාම මුදල් ගෙව්වේ නෑ.අපි බංකොලොත් වෙන්නේ එක පුද්ගලයෙකුට සේරම මුදල් දුන්නාම.ස්ථාවර තැන්පතුව බින්දුව උනාම.හදිසි බෑ. ස්ථාවර තැන්පතුව නැතිව මුදල් නැත්ද?

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

ලක්ස 22යි මාසික වියදම.19 ක් ආදායම් එනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

අපිත් වගකිම ගන්න ඕනි.ආන්ඩුකාර තුමා සමග සාකච්ජා කරමු.මේ මුදල් නිදහස් කල යුතුයි.නඩු දැම්මොත් අපිත් වගඋත්තරකරු.ආන්ඩුකාරතුමාට කියලා මුදල් නිදහස් කරදෙන්න ඉල්ලමු. මේ සති දෙක ආදායම් එකතුකිරීම කඩිනම් කරන්න.එෆ්.ඩි. ගත්තොත් ගැටළු.මාත් එන්නම්.තියෙන මුදල සුරක්ෂිත කරන්න.ඉලක්කවලට මුදල් නැති උනොත් බලමු.කිසිවෙක් මේකට අදාල නෑ. තියෙන සමාජ තත්වය මතයි මේක උනේ.තියෙන මුදලින් නය ටික ගෙවමු.කලබල වෙලා බෑ.සඳුදා යමු.මෙතන වාද කලා වගේ මේකෙන් ගැලවෙන්න බෑ. ඒ මුදල් ගෙවන විධිහක් ඕනි.තරහා අරගෙනත් බෑ. මේ ගෙදර නෙවෙයි.සියළු දෙනා එකඟ නැත්තේ ඒකයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා :-</u>

කොන්ත්‍රාත්කරුට අපිටඑරෙහිව නඩු දාන්න බෑ.අතීතයේ වසර ගනන් නොගෙවපුවත් තියෙනවා තාම.උප සභාපතිතුමා කීව විධිහට බරපතල මූල්‍ය විනය ගැටළුවක්.50% ටවත් මේ මුදල තියන්න තිබුනා.
වැය කරලා අපිමයි වැඩ කරලා තියෙන්නේ.මෙතන ගැටළුව මේ වෙලාවේ ස්ථාවර තැන්පතුව සම්බන්ධවයි.ඒකට අත නොතියා අපි කටයුතු කරමු.ආන්ඩුකාරතුමා හරහා මුදල් ගමු.
<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

උසාවි දඩ ආවොත් එක්කෙනෙක් නිවන් දැකලා බෑ.අනිත් අයටත් ගැටළු.කොටස් ගෙවන්න.උසාවි දඩ වලින් 50% ක් ගෙවමු.අනිත් අයට ත් ඉතිරි50% ගෙවමු.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
<u>මෙය තීන්දුවක් ලෙස ගමු.</u>

**කුරුවිට ප්‍රාදේශිය සභා වෙළඳ සංකීර්ණයේ ඉහල මහලේ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරිම 02 අධියර ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ උසාවි දඩ හා මුද්දර ගාස්තු වලින් ලැබෙන මුදලින් 50% ක් ගෙවීමට යෝජනා කරමි.**
<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>
එම යෝජනාව ස්ථිර කරමි.
මුද්දර ගාස්තු වලින්50%. සහා කර්මාන්ත වලට 50%.ලක්ෂ 22 ක් වැයවෙනවානම් එන්නේ 18ක් නම් ඉතිරිය පියවන්නේ කොහොමද,ජනතාවට පීඩා.මුදල්නෑ. මේවෙලාවේ කව්රුවත් දෙන්නේ නෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් දර්ශන මහතා :-</u>
දෙකෝටි ගාන එනවානම් අර මුදල ඉතිරියි.ලක්ෂ තුනේ ගැටළුව නෑ.50% උසාවි දඩහා මුද්දර ගාස්තු වලින් ගෙවිම සුදුසුයි. කොන්ත්‍රාත් සේවා අවසන් කරන්න.සෞඛ්‍ය වෙනත් වැඩ කරන අය බහුකාර්ය යොදවන්න.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් ජයරත්න මහතා :-</u>
සභානඩු වසර දෙකකට කල්දාමු.නීතිඥ ගාස්තු ත්.ඉතිරියි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-</u>
එහෙම බෑ.ප්‍රායෝගික නෑ.
<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>
මේ ගැටළුව කිරිඇල්ලටත් එයි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
කඩ බදුදීලා ඒක ගෙවන්නේ.තක්සේරුවට ඇරලා තියෙන්නේ.තක්සේරුව කඩිනමින් ගෙන්නාගමු.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන **යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභා වෙළඳ සංකීර්ණයේ ඉහල මහලේ සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරිම 02 අධියර ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රාදේශීය සභාවේ**

**උසාවි දඩ හා මුද්දර ගාස්තු වලින් ලැබෙන මුදලින් 50% ක් ගෙවීමට මහා සභා අනුමැතියලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2022.06.10 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-09 උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්. එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

**05-10. කුරුවිට ප්‍රාදේශිය සභා ශ්‍රවනාගාරය ඉදිකිරිම 2 අධියර විශේෂ ගාස්තු උපලේඛනය 1 සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.**
<u>ගරු සභාපති  ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**කුරුවිට ප්‍රාදේශිය සභා ශ්‍රවනාගාරය ඉදිකිරිම 2 අධියර විශේෂ ගාස්තු උපලේඛනය 1 සඳහා මහා සභා අනුමැතියලබා දීමට යෝජනා කරමි.අදාල උපලේඛනය ඉදිරිපත් කරමි. අදාල උපලේඛනය සභාගත කරන ලදි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභා ශ්‍රවනාගාරය ඉදිකිරිම 2 අධියර විශේෂ ගාස්තු උපලේඛනය 1 සඳහා මහා සභා අනුමැතියලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxxx**

**<u>2022.06.10 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-11 උද්ධෘතය</u>**

**05-11.** කුරුවිට ප්‍රාදේශිය සභා අදාහනාගාරයේ ආදාහන කටයුතු වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව සංශෝධනය කිරිම සම්බන්ධ යෝජනාව.

- <u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

කුරුවිට ප්‍රාදේශිය සභා අදාහනාගාරයේ ආදාහන කටයුතු වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව සංශෝධනය කිරිම ට මේ වන විට අවශ්‍ය වී ඇත.ආදාහනාගාරයේ ආදාහනයක් සිදු කිරීමට යන වියදම සම්බන්ධයෙන් කාර්මික නිලධාරි විසින් එක් මසකට ඇස්තමේන්තුව ඉදිරිපත්කර ඇත.ඒ අනුව පහත සඳහන් පරිදි එම වැය ඇස්තමේන්තුව ඉදිරිපත්කරමි.

ආදාහන

| | | |
|---|---|---|
| 1.ආදාහන 39 සඳහා ගෑස් ප්‍රමානය | -39 x 13.80 | =538.20kg |
| 2.ඒ සඳහා වියදම | -538.20 kg x491.00 | =264256.20 |

වැටුප්/ අතිකාල

| | |
|---|---|
| 01.කම්කරු( ස්ථිර ) - | 40800.00 |
| 02. කම්කරු( ස්ථිර ) - | 40300.00 |
| 03.කම්කරු (අනියම් ) - | 33906.24 |

| | |
|---|---|
| 01.කම්කරු( ස්ථිර ) - | 13637.00 |
| 02. කම්කරු( ස්ථිර ) - | 11666.00 |
| 03.කම්කරු (අනියම් ) - | 5239.00 |

| | | |
|---|---|---|
| විදුලි බිල | | 5693.40 |
| තණකොල කපන යන්ත්‍ර සඳහා ඉන්ධන | 4 x254.00 | 1016.00 |

**416513.84**

**ක්ෂය වීම ( ආදාහනාගාරය )10% 41651.38**

**ආදාහන 39 සඳහා 458165.22**

**ආදාහන 01 සඳහා 11747.82**

**මේ අනුව එක් ආදාහනයක් සඳහා මේ වන විට රු.11747.82 ක මුදලක් වැයවේ.ආදාහනාගාරය පාඩු ලබන තත්වයට පත්න ඇති අතර රටේ වත්මන් තත්වය අනුව මෙය පවත්වාගෙන යාම සඳහා යම් අයකිරීම් වැඩි කිරීමක් සිදු කිරීමට අවශ්‍ය වේ.මේ වන විට අයකරනුයේ බල ප්‍රදේශය ඇතුලත රු.8500.00යි. පිටත රු.9500.00 යි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**

**මාස තුනක් යන තෙක් වැඩි නොකර ඉමු.මෙය ජනතාවට ඉතා දුෂ්කර කාලයක්.**

**- <u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

**නමුත් මේ අවස්ථාවේ වැඩිකිරීම සිදු නොකල හොත් පවත්වාගෙන යාමේ ගැටළු ඇතිවේවි. ඒ අනුව කුරුවිට ප්‍රාදේශිය සභා අදාහනාගාරයේ ආදාහන කටයුතු වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව බල ප්‍රදේශය ඇතුලත ආදාහන සඳහා රු.10000.00 ක් හා පිටත ආදාහන සඳහා රු.11000.00 වන ලෙස ගාස්තුව සංශෝධනය කිරිමට ත් මෙම අයකිරිම් 2022.06.17 දින සිට ක්‍රියාත්මක කිරිමටත් යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.බැරල් දෙකකට ජලය යොදා එහි සිලින්ඩර බහා තැබීමේ ක්‍රමවේදය තුලින් ගෑස් අරපරිස්සමින් භාවිත කලහැක.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිප්ති චන්දන මහතා :-</u>**

**මුදල වැඩිකිරීම සිදුකල යුතුවේ. රු.10000.00 ක් හා පිටත රු.11000.00 වනලෙස අයකරමු.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදිප් මහතා :-</u>**

**ජෙනරේටරය තවමත් හදලා නෑ.අපි දැඩි අපහසුතාවයට පත්වුනා. ආදාහන කටයුත්තකදි.කඩිනමින් හදන්න.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා :-</u>**

**ගෑස් සම්බන්ධව අධීක්ෂනය කරන්න.**

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

**ජෙනරේටරය අළුත්වැඩියා කල නොහැකි නම් අළුතින් හෝ එකක් ගමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභා අදාහනාගාරයේ ආදාහන කටයුතු වෙනුවෙන් අයකරනු ලබන ගාස්තුව බල ප්‍රදේශය ඇතුලත ආදාහනයක් සඳහා රු.10000.00 ක් හා පිටත ආදාහනයක් සඳහා රු.11000.00 වන ලෙස ගාස්තුව සංශෝධනය කිරිමට ත් මෙම අයකිරිම්

**2022.06.17 දින සිට ක්‍රියාත්මක කිරිමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2022.06.10 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-11 උදෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්. එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

**05-12. කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් ආර්.ඩී.ඒ.වෙළඳ සංකීර්නයේ අංක 13 කඩ කාමරය නම් සංශෝධනය කිරිම සම්බන්ධ යෝජනාව.**
- <u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් ආර්.ඩී.ඒ.වෙළඳ සංකීර්නයේ අංක 13 කඩ කාමරය නම් සංශෝධනය කිරිම සම්බන්ධව මුල් බදු කරු වන අංක 419/1 සිනමාහල පාර,කුරුවිට පදිංචි කේ.ඩී. සුනීතා මිය විසින් සිදු කර ඇති ඉල්ලිම අනුව අතුරු බදු කරු වන මිහිදු පෙදෙස මිල්ලවිටිය කුරුවිට පදිංචි ඩබ්.ඒ.සුනන්දා පතිරන මිය නමින් අංක 13 කඩ කාමරය බදු අයිතිය අතුරුබදු කරුගේ නමින් ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත.පලාත් පාලන කොමසාරිස් ගේ අංක 03/2020 චක්‍රලේඛයේ සඳහන් පරිදි අවශ්‍ය ලේඛන ඉදිරිපත්කර ඇත. ඒ අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් ආර්.ඩී.ඒ.වෙළඳ සංකීර්නයේ අංක 13 කඩ කාමරය නම් සංශෝධනය කිරිම සම්බන්ධව මුල් බදු කරු වන අංක 419/1 සිනමාහල පාර,කුරුවිට පදිංචි කේ.ඩී. සුනීතා මිය විසින් සිදු කර ඇති ඉල්ලිම අනුව අතුරු බදු කරු වන මිහිදු පෙදෙස මිල්ලවිටිය කුරුවිට පදිංචි ඩබ්.ඒ.සුනන්දා පතිරන මිය නමින් අංක 13 කඩ කාමරය බදු අයිතිය අතුරුබදු කරුගේ නමින් ලබා දීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් ආර්.ඩී.ඒ.වෙළඳ සංකීර්නයේ අංක **13** කඩ කාමරය නම් සංශෝධනය කිරිම සම්බන්ධව මුල් බදු කරු වන අංක **419/1** සිනමාහල පාර,කුරුවිට පදිංචි කේ.ඩී. සුනීතා මිය විසින් සිදු කර ඇති ඉල්ලිම අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් ආර්.ඩී.ඒ.වෙළඳ සංකීර්නයේ අංක **13** කඩ කාමරය නම් සංශෝධනය කිරිම සම්බන්ධව මුල් බදු කරු වන අංක **419/1** සිනමාහල පාර,කුරුවිට පදිංචි කේ.ඩී. සුනීතා මිය විසින් සිදු කර ඇති ඉල්ලිම අනුව අතුරු බදු කරු වන මිහිඳු පෙදෙස මිල්ලවිටිය කුරුවිට පදිංචි ඩබ්.ඒ.සුනන්දා පතිරන මිය නමින් අංක **13** කඩ කාමරය බදු අයිතිය අතුරුබදු කරුගේ නමින් ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxx**

**05-13.**කිරිඇල්ල පොදුවෙළදපල අංක **05** කඩ කාමරය නම් සංශෝධනය කිරිම සම්බන්ධ යෝජනාව

- <u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

කිරිඇල්ල පොදුවෙළදපල අංක **05** කඩ කාමරය නම් සංශෝධනය කිරිම සම්බන්ධව දිගුකාලීන බදුකරුවන ඉඩංගොඩ කිරිඇල්ල පදිංචි එම්.ඒ.ආර්. පේද්‍රික් යන අය විසින් තමාගේ වයෝවෘර්ධභාවය හේතුවෙන් එම කඩ කාමරය තම දියනිය වන ඉඩංගොඩ කිරිඇල්ල පදිංචි එම්.ඒ. රංජනි සුනිලා යන අය වෙත බදු අයිතිය පවරාදෙන ලෙස ඉල්ලා ඇත.අදාල ලිපිලේඛන ඉදිරිපත්කර ඇත.ඒ අනුව කිරිඇල්ල පොදුවෙළදපල අංක **05** කඩ කාමරය ඉඩංගොඩ කිරිඇල්ල පදිංචි එම්.ඒ. රංජනි සුනිලා මිය නමින් බදු අයිතිය අතුරු බදු කරුගේ නමින් ලබා දීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>
එම යෝජනාව ස්ථිර කරමි.නීත්‍යානුකූලව කටයුතු කරන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා කිරිඇල්ල පොදුවෙළදපල අංක **05** කඩ කාමරය දිගුකාලීන බදුකරුවන ඉඩංගොඩ කිරිඇල්ල පදිංචි එම්.ඒ.ආර්. පේද්‍රික් යන අයගේ ඉල්ලීම අනුව අනුව කිරිඇල්ල පොදුවෙළදපල අංක **05** කඩ කාමරය ඉඩංගොඩ කිරිඇල්ල පදිංචි එම්.ඒ. රංජනි සුනිලා මිය නමින් බදු අයිතිය අතුරු බදු කරුගේ නමින් නීත්‍යානුකූල ක්‍රමවේදය අනුව ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxx**

**05-14. 2022** වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවට වෙළඳ බලපත්‍ර,ව්‍යාපාර බදු ගෙවීම සම්බන්ධ යෝජනාව.
<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>
**2022** වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවට වෙළඳ බලපත්‍ර,ව්‍යාපාර බදු ගෙවීම සම්බන්ධව සීමාසහිත කුරුවිට විවිධසේවා සමූපකාර සමිතිය විසින් ඉල්ලීම් ලිපියක් ඉදිරිපත්කර ඇත. ඒ

අනුව සිමාසහිත කුරුවිට විවිධසේවා සමූපකාර සමිතිය ට අයත් ග්‍රාමීය බැංකු, උකස් මධ්‍යස්ථාන ප්‍රාෙද්ශීය හා අනෙකුත් වෙළඳසැල් සඳහා රු.52000.00ක මුදලක් 2022.03.11 දින ගෙවීම් කර ඇත.සභාව විසින් බදු ගෙවන ලෙස ලිපි යවා ඇත්තේ 2022.02.11 දිනය.නැවත ඔවුන් විසින් 2022.04.06 දින ලිපියක් ඉදිරිපත්කරමින් ප්‍රාෙද්ශිකයන් 15 වසා ඇති බවත් ඊට සිදුකල ගෙවීම් , ගෙවීම් සිදු නොකල ස්ථාන සඳහා සේ සලකන ලෙස සංශෝධනය කර දෙන ලෙස ඉල්ලීමක් සිදුකර ඇත.නමුත් බිල් කිරිමට පෙර ඔවුන් (2022.03.11 ට පෙර ) ඒ පිලිබඳව සභාව දැනුවත්කර නොමැති අතර ආදායම් පරීක්ෂක වාර්තාව අනුව එම ගෙවීම් 2022 වර්ෂයේ ආදායමට ගනනය කර ඇති නිසා කපා හැරීමක් ද සිදුකල නොහැක.ඒ අනුව 2022 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවට වෙළඳ බලපත්‍ර,ව්‍යාපාර බදු ගෙවීම සම්බන්ධ සිමාසහිත කුරුවිට විවිධසේවා සමූපකාර සමිතියේ ඉල්ලීම පරිදි ප්‍රාෙද්ශිකයන් 15 ක් වසා පැවතියද බිල් කිරිමට පෙර ඒ පිලිබඳව සභාව දැනුවත්කර නොමැති හෙයින් හා ආදායම් පරීක්ෂක වාර්තාව අනුව එම ගෙවීම් 2022 වර්ෂයේ ආදායමට ගනනය කර ඇති නිසා ගෙවා ඇතිබදු ගෙවීම් සිදු නොකල ස්ථාන සඳහා ගැලපීමක් සිදු කල නොහැකි බවත් ඉදිරි වසරේදි එසේ ගැලපීමක් සිදුකලහැකි බවත් දන්වා ලිපියක් යොමු කිරීමටත් යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

එම යෝජනාව ස්ථිර කරමි

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

කරුනු පැහැදිලි කර ලිපිය යොමුකරන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා 2022 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවට වෙළඳ බලපත්‍ර,ව්‍යාපාර බදු ගෙවීම සම්බන්ධ සිමාසහිත කුරුවිට විවිධසේවා සමූපකාර සමිතියේ ඉල්ලීම පරිදි ප්‍රාෙද්ශිකයන් 15 ක් වසා පැවතියද බිල් කිරිමට පෙර ඒ පිලිබඳව සභාව දැනුවත්කර නොමැති හෙයින් හා ආදායම් පරීක්ෂක වාර්තාව අනුව එම ගෙවීම් 2022 වර්ෂයේ ආදායමට ගනනය කර ඇති නිසා ගෙවා ඇතිබදු ගෙවීම් සිදු නොකල ස්ථාන සඳහා ගැලපීමක් සිදු කල නොහැකි බවත් ඉදිරි වසරේදි එසේ ගැලපීමක් සිදුකලහැකි බවත් දන්වා ලිපියක් යොමු කිරීමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**<u>2022.06.10 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-15 උද්ධෘතය</u>**

**05-15.එල්ලාවල උපකාර්යාලයේ වරිපනම් විරෝධතා තීරනය අංක 04 හි අභාවිත අංක සංශෝධනය කිරීම සම්බන්ධ යෝජනාව.**

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>**

**එල්ලාවල උපකාර්යාලයට අයත් 2022.03.11 දින සභා**

**තීරන 5-19 යටතේ සභාවට ඉදිරිපත්කල වරිපනම් විරෝධතා තීරනය අංක 04 හි අභාවිත අංක පහත පරිදි සංශෝධනය කිරීමට යෝජනා කරමි.**

<table>
<tr><td>විරෝධතා තීරන අංකය</td><td>වරිපනම් අංකය</td><td>පාර</td><td>වාර්ෂික වටිනාකම</td><td colspan="5">පහත පරිදි සංශෝධනය කරන ලදි.</td></tr>
<tr><td rowspan="3">04</td><td rowspan="3">590/9</td><td rowspan="3">රත්නපුර පාර</td><td rowspan="3">4811.00</td><td>ඉදිරිපත්කල අභාවිත අංකය</td><td>නිවැරදි කල යුතු අභාවිත අංකය</td><td>නව අංකය</td><td>දේපල විස්තරය</td><td>වාර්ෂික වටිනාකම රු.</td></tr>
<tr><td>560/9</td><td>590/9</td><td rowspan="2">590/100</td><td rowspan="2">ඇස්බැස්ටස් වහල සහිත නිවස</td><td rowspan="2">34642.00</td></tr>
<tr><td>590/10</td><td>590/100</td></tr>
</table>

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>**

**එම යෝජනාව ස්ථිර කරමි**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව එල්ලාවල උපකාර්යාලයට අයත් 2022.03.11 දින සභා තීරන 5-19 යටතේ**

**සභාවට ඉදිරිපත්කල වරිපනම් විරෝධතා තීරනය අංක 04 හි අභාවිත අංක ඉහත පරිදි සංශෝධනය කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2022.06.10 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-15 උද්ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්. එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

**05-16.ඇල්ලගාව ග්‍රාම නිලධාරිවසමේ අ.ග.සි.218 ලොට් 1005 කැබලි අංක 01 දරන ඉඩම් කොටස දීර්සකාලීන බදු ලබාදීමට මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>

**ඇල්ලගාව ග්‍රාම නිලධාරිවසමේ අ.ග.සි.218 ලොට් 1005 කැබලි අංක 01 දරන ඉඩම් කොටස දීර්සකාලීන බදු ලබාදීමට මහා සභා අනුමැතිය ලබාදෙන ලෙස කිරිඇල්ල ප්‍රාදේශිය ලේකම් විසින් ඉල්ලිමක් කර ඇත.ඒ අනුව ඇල්ලගාව ග්‍රාම නිලධාරිවසමේ අ.ග.සි.218 ලොට් 1005 කැබලි අංක 01 දරන ඉඩම් කොටස ප්‍රමානයෙන් හෙක්.0.225 ක් වන අතර එම ඉඩම**

ගමරාලලාගේ විජේසේන යන නමින් කෘෂි කටයුතු සඳහා දීර්ඝ කාලින බදු දීමට බදු බලපත්‍ර සැකසීම සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.
අදාල ඉඩම් කොටසේ අනුරේඛනය මේ සමග ඉදිරිපත් කර ඇත. එසේම මෙම ඉඩම සභාවට පවරාගැනීමට අදහසක් නොමැති බවට කාර්මික නිලධාරි වාර්තා කර ඇත.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>
එම යෝජනාව ස්ථිර කරමි

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>
සංස්කෘතික මධ්‍යස්ථානය පිහිටි සභාවේ ඉඩම සම්බන්ධව ප්‍රාදේශිය ලේකම් වරයා මෙවැනි අනුමැතියක් ඉල්ලුවේ නෑ.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව ඇල්ලගාව ග්‍රාම නිලධාරිවසමේ අ.ග.සි.218 ලොට් 1005 කැබලි අංක 01 දරන ඉඩම් කොටස ප්‍රමානයෙන් හෙක්.0.225 ක් වන අතර එම ඉඩම ගමරාලලාගේ විජේසේන යන නමින් කෘෂි කටයුතු සඳහා දීර්ඝ කාලින බදු දීමට බදු බලපත්‍ර සැකසීම සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

**05-17.** ඇල්ලගාව ග්‍රාම නිලධාරිවසමේ අ.ග.සි.218 ලොට් 1005 කැබලි අංක 16 දරන ඉඩම් කොටස දීර්ඝකාලීන බදු ලබාදීමට මහා සභා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>

ඇල්ලගාව ග්‍රාම නිලධාරිවසමේ අ.ග.සි.218 ලොට් 1005 කැබලි අංක 16 දරන ඉඩම් කොටස දීර්ඝකාලීන බදු ලබාදීමට මහා සභා අනුමැතිය ලබාදෙන ලෙස කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් විසින් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව ඇල්ලගාව ග්‍රාම නිලධාරිවසමේ අ.ග.සි.218 ලොට් 1005 කැබලි අංක 16 දරන ඉඩම් කොටස ප්‍රමානයෙන් හෙක්.0.150 ක් වන අතර එම ඉඩම ගමරාලලාගේ විජේසේන යන නමින් කෘෂි කටයුතු සඳහා දීර්ඝ කාලින බදු දීමට බදු බලපත්‍ර සැකසීම සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.
අදාල ඉඩම් කොටසේ අනුරේඛනය මේ සමග ඉදිරිපත් කර ඇත. එසේම මෙම ඉඩම සභාවට පවරාගැනීමට අදහසක් නොමැති බවට කාර්මික නිලධාරි වාර්තා කර ඇත.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>
එම යෝජනාව ස්ථිර කරමි

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව ඇල්ලගාව ග්‍රාම නිලධාරිවසමේ අ.ග.සි.218 ලොට් 1005 කැබලි අංක 16 දරන ඉඩම් කොටස ප්‍රමානයෙන් හෙක්.0.150 ක් වන අතර එම ඉඩම ගමරාලලාගේ විජේසේන යන නමින් කෘෂි කටයුතු සඳහා දීර්ඝ කාලින බදු දීමට බදු බලපත්‍ර සැකසීම සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-14. 2022 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවට වෙළඳ බලපත්‍ර,ව්‍යාපාර බදු ගෙවීම සම්බන්ධ යෝජනාව.**

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>**

**2022 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවට වෙළඳ බලපත්‍ර,ව්‍යාපාර බදු ගෙවීම සම්බන්ධව සීමාසහිත කුරුවිට විවිධසේවා සමූපකාර සමිතිය විසින් ඉල්ලීම් ලිපියක් ඉදිරිපත්කර ඇත. ඒ අනුව සීමාසහිත කුරුවිට විවිධසේවා සමූපකාර සමිතිය ට අයත් ග්‍රාමීය බැංකු, උකස් මධ්‍යස්ථාන ප්‍රාදේශීය හා අනෙකුත් වෙළඳසැල් සඳහා රු.52000.00ක මුදලක් 2022.03.11 දින ගෙවීම් කර ඇත.සභාව විසින් බදු ගෙවන ලෙස ලිපි යවා ඇත්තේ 2022.02.11 දිනය.නැවත ඔවුන් විසින් 2022.04.06 දින ලිපියක් ඉදිරිපත්කරමින් ප්‍රාදේශිකයන් 15 වසා ඇති බවත් ඊට සිදුකල ගෙවීම් , ගෙවීම් සිදු නොකල ස්ථාන සඳහා සේ සලකන ලෙස සංශෝධනය කර දෙන ලෙස ඉල්ලීමක් සිදුකර ඇත.නමුත් බිල් කිරිමට පෙර ඔවුන් (2022.03.11 ට පෙර ) ඒ පිලිබඳව සභාව දැනුවත්කර නොමැති අතර ආදායම් පරීක්ෂක වාර්තාව අනුව එම ගෙවීම් 2022 වර්ෂයේ ආදායමට ගනනය කර ඇති නිසා කපා හැරීමක් ද සිදුකල නොහැක.ඒ අනුව 2022 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවට වෙළඳ බලපත්‍ර,ව්‍යාපාර බදු ගෙවීම සම්බන්ධ සීමාසහිත කුරුවිට විවිධසේවා සමූපකාර සමිතියේ ඉල්ලීම පරිදි ප්‍රාදේශිකයන් 15 ක් වසා පැවතියද බිල් කිරිමට පෙර ඒ පිලිබඳව සභාව දැනුවත්කර නොමැති හෙයින් හා ආදායම් පරීක්ෂක වාර්තාව අනුව එම ගෙවීම් 2022 වර්ෂයේ ආදායමට ගනනය කර ඇති නිසා ගෙවා ඇතිබදු ගෙවීම් සිදු නොකල ස්ථාන සඳහා ගැලපීමක් සිදු කල නොහැකි බවත් ඉදිරි වසරේදි එසේ ගැලපීමක් සිදුකලහැකි බවත් දන්වා ලිපියක් යොමු කිරීමටත් යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>**

**එම යෝජනාව ස්ථිර කරමි**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**

**කරුනු පැහැදිලි කර ලිපිය යොමුකරන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා 2022 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශිය සභාවට වෙළඳ බලපත්‍ර,ව්‍යාපාර බදු ගෙවීම සම්බන්ධ සීමාසහිත කුරුවිට විවිධසේවා සමූපකාර සමිතියේ ඉල්ලීම පරිදි ප්‍රාදේශිකයන් 15 ක් වසා පැවතියද බිල් කිරිමට පෙර ඒ පිලිබඳව සභාව දැනුවත්කර නොමැති හෙයින් හා ආදායම් පරීක්ෂක වාර්තාව අනුව එම ගෙවීම් 2022 වර්ෂයේ ආදායමට ගනනය කර ඇති නිසා ගෙවා ඇතිබදු ගෙවීම් සිදු නොකල ස්ථාන සඳහා ගැලපීමක් සිදු කල නොහැකි බවත් ඉදිරි වසරේදි එසේ ගැලපීමක් සිදුකලහැකි බවත් දන්වා ලිපියක් යොමු කිරීමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-15.එල්ලාවල උපකාර්යාලයේ වරිපනම් විරෝධතා තීරනය අංක 04 හි අභාවිත අංක සංශෝධනය කිරීම සම්බන්ධ යෝජනාව.**

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>**

**එල්ලාවල උපකාර්යාලයට අයත් 2022.03.11 දින සභා තීරන 5-19 යටතේ සභාවට ඉදිරිපත්කල වරිපනම් විරෝධතා තීරනය අංක 04 හි අභාවිත අංක පහත පරිදි සංශෝධනය කිරීමට යෝජනා කරමි.**

| විරෝධතා තීරන අංකය | වරිපනම් අංකය | පාර | වාර්ෂික වටිනාකම | පහත පරිදි සංශෝධනය කරන ලදි. | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **04** | **590/9** | රත්නපුර පාර | **4811.00** | ඉදිරිපත්කල අභාවිත අංකය | නිවැරදි කල යුතු අභාවිත අංකය | නව අංකය | දේපල විස්තරය | වාර්ෂික වටිනාකම රු. |
| | | | | **560/9** | **590/9** | **590/100** | ඇස්බැස්ටස් වහල සහිත නිවස | **34642.00** |
| | | | | **590/10** | **590/100** | | | |

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

**එම යෝජනාව ස්ථිර කරමි**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව එල්ලාවල උපකාර්යාලයට අයත් 2022.03.11 දින සභා තීරන 5-19 යටතේ සභාවට ඉදිරිපත්කල වරිපනම් විරෝධතා තීරනය අංක 04 හි අභාවිත අංක ඉහත පරිදි සංශෝධනය කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2022.06.10 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-18 උද්ධෘතය**

**05-18.** කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් මහජන පුස්තකාල වලට අදාලව උපදේශක කමිටුව පිහිටුවීම සම්බන්ධ යෝජනාව

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා -**

**කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් මහජන පුස්තකාල වලට අදාලව උපදේශක කමිටුව පිහිටුවීම සිදුකල යතු අතර පුස්තකාල අතුරු අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව එම කමිටුව පිහිටුවිය යුතුයි.**
**ඒ අනුව පුස්තකාල උපදේශක කමිටුව සඳහා සභාවේ ගරු සභාපතිවරයා,(කමිටුවේ සභාපති) ගරු ප්‍රාසම ධනවර්ධන මහතා,ගරු ප්‍රාසම දයා කස්තුරි මිය,ගරු ප්‍රාසම දේවින්ද කුමාර මහතා,ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ගරු ස්වාමින් වහන්සේ,පල්ලියේ පූසාරි තුමා, කුරුක්කල් තුමා, කුරුවිට හා කිරිඇල්ල ජාතික පාසැල්වල විදුහල්පතිවරු,සිංගර් ආයතනයේ කලමනාකරු,සභාවේ ලේකම්තුමිය,( කැඳවුම්කරු)ප්‍රජා සම්බන්ධතා නිලධාරි,ප්‍රධාන**

පුස්තකාලයේ පුස්තකාලයාධිපති,(කමිටුවේ ලේකම්)ප්‍රජාමන්ඩල නියෝජිතයෙක් හා ධර්මසේන කොඩිතුවක්කු මහතා සුදුසු බවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

එම යෝජනාව ස්ථිර කරමි

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් මහජන පුස්තකාල වලට අදාලව උපදේශක පුස්තකාල උපදේශක කමිටුව සඳහා සභාවේ ගරු සභාපතිවරයා,(කමිටුවේ සභාපති) ගරු ප්‍රාසම ධනවර්ධන මහතා,ගරු ප්‍රාසම දයා කස්තුරි මිය,ගරු ප්‍රාසම දේවින්ද කුමාර මහතා,ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ගරු ස්වාමින් වහන්සේ පල්ලියේ පූසාරි තුමා, කුරුක්කල් තුමා, කුරුවිට හා කිරිඇල්ල ජාතික පාසැල්වල විදුහල්පතිවරු,සිංගර් ආයතනයේ කලමනාකරු,සභාවේ ලේකම්තුමිය,( කැඳවුම්කරු)ප්‍රජා සම්බන්ධතා නිලධාරි,ප්‍රධාන පුස්තකාලයේ පුස්තකාලයාධිපති,(කමිටුවේ ලේකම්)ප්‍රජාමන්ඩල නියෝජිතයෙක් හා ධර්මසේන කොඩිතුවක්කු මහතා සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

**2022.06.10** දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක **05-18** උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

එස්. එච්.ආර්.වීරක්කොඩි,
ලේකම්,
ප්‍රාදේශිය සභාව,
කුරුවිට.

<u>**2022.06.10** දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක **05-19** උද්‍ධෘතය</u>

**05-19.**ගරු සභාපතිතුමාගේ නිල රථය වන **PF 7449** කැබ්රථය සඳහා ඉන්ධන සීමාවන් පැනවීම සම්බන්ධ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

සභාපතිතුමාගේ නිල රථය වන **PF 7449** කැබ්රථය සඳහා ඉන්ධන සීමාවන් පැනවීම වාර්ෂිකව සිදුකලයුතු අතර මසකටඉන්දන ලීටර් **700** ක ප්‍රමානය ක් ලබාදීමට යෝජනා කරමි.පසුගිය වර්ෂයේ ලීටර් **750** ක් තිබුනා.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>
**එම යෝජනාව ස්ථිර කරමි**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.
**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව සභාපතිතුමාගේ නිල රථය වන PF 7449 කැබ්රථය සඳහා මසකට ඉන්ධන ලීටර් 700 ක ප්‍රමානය ක් ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2022.06.10 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-19 උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්. එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

**05-.20 -ඇස්තමේන්තු-නොමැත.**

**2022.06.10 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-21 උද්‍ධෘතය**

**05-21.** ගවමස් වෙළඳසැලකට බලපත්‍රයක් ලබාගැනීම

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

ඇහැලියගොඩ,අස්ගගුල උතුර මීගහවත්ත ඩබ්.එල්.එම්.එස්.එම්.රියාද් මහතා හට අංක 214 බදුවත්ත ඇහැලියගොඩ යන ස්ථානයේ පිහිටි කඩ කාමරයට ගවමස් වෙළඳසැලක් පවත්වාගෙන යාමට වාර්ෂික බලපත්‍රයක් ලබාදෙන ලෙස ඉල්ලීම් කර තිබෙනවා.ඒ අනුව ඇහැලියගොඩ,අස්ගගුල උතුර මීගහවත්ත ඩබ්.එල්.එම්.එස්.එම්.රියාද් මහතා හට අංක 214 ,බදුවත්ත ඇහැලියගොඩ යන ස්ථානයේ පිහිටි කඩ කාමරයට ගවමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක,ආදායම් පරිපාලක වාර්තාගෙන වාර්ෂික බලපත්‍රයක් නීත්‍යානුකූලව ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-

**එම යෝජනාව ස්ථිර කරමි**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා ඇහැලියගොඩ,අස්ගගුල උතුර මීගහවත්ත ඩබ්.එල්.එම්.එස්.එම්.රියාද් මහතාගේ ඉල්ලීම අනුව ඇහැලියගොඩ,අස්ගගුල උතුර මීගහවත්ත ඩබ්.එල්.එම්.එස්.එම්.රියාද් මහතා හට අංක 214 ,බදුවත්ත ඇහැලියගොඩ යන ස්ථානයේ පිහිටි කඩ කාමරයට ගවමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක,ආදායම් පරිපාලක වාර්තාගෙන වාර්ෂික බලපත්‍රයක් නීත්‍යානුකූලව ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2022.06.10** දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක **05-21** **උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්. එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

**<u>2022.06.10 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-22 උද්‍ධෘතය</u>**

**<u>05-22රක්ෂන ආයතන වලින් මිල ඇස්තමේන්තු කැඳවීම සම්බන්ධ යෝජනාව</u>**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**අප සභාවට අයත් සියළුම වාහන වල රක්ෂනයන් මිල ගනන් කැඳවීමකින් තොරව ශ්‍රී ලංකා රක්ෂන සංස්ථාවෙන් සිදුකරගනු ලබන අතර නමුත් වෙනත් ආයතන වලින් මිල ඇස්තමේන්තු කැඳවීම මගින් අවම මිල ඇස්තමේන්තුව සහිත ආයතන තෝරා රක්ෂන කටයුතු සිදුකර ගැනිමට හැකියාවක් පවතින බැවින් ඒ සඳහා තරඟකාරි ආයතන වලින් මිල ඇස්තමේන්තු කැඳවීමට මහා සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-</u>

**එම යෝජනාව ස්ථිර කරමි**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව අප සභාවට අයත් සියළුම වාහන වල රක්ෂනයන් මිල ගනන් කැඳවීමකින් තොරව ශ්‍රී ලංකා රක්ෂන සංස්ථාවෙන් සිදුකරගනු ලබන අතර නමුත් වෙනත් ආයතන වලින් මිල ඇස්තමේන්තු කැඳවීම මගින් අවම මිල ඇස්තමේන්තුව සහිත ආයතන තෝරා රක්ෂන කටයුතු සිදුකර ගැනිමට හැකියාවක් පවතින බැවින් ඒ සඳහා තරඟකාරි ආයතන වලින් මිල ඇස්තමේන්තු කැඳවීමට මහා සභා අනුමැතිය ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2022.06.10** දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක **05-22 උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.**

**එස්. එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

**<u>2022.06.10 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-23 උද්‍යතයේ</u>**

**<u>05-23 කඩයක් පවත්වාගෙන යාමට ස්ථානයක් ලබාගැනීම සම්බන්ධ යෝජනාව</u>**
**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

**කුරුවිට සිනමාහලපාර,එක්නැලිගොඩ පදිංචි ආර්.එල් සජානි විජේනායක මිය විසින් ලිපියක් ඉදිරිපත්කරමින් ඇයවසර 20 පමන කුරුවිට නගරයේ වෙළඳාම් කරමින් ජීවත්වූ අතර සැමිය අසනීප වීම නිසා එම වෙළඳාම අහිමි වූබවත් දරුවන් 5ක් සමග ජීවත්වීම අසිරු වී ඇති අතර එමනිසා වෙළදාමක් කරගැනිමට ස්ථානයක් ඉල්ලා සිටි.ඒ අනුව ආර්.එල් සජානි විජේනායක මියගේ ඉල්ලීම අනුව වෙළදාමක් කරගැනිමට ස්ථානයක්ලබාදීම සම්බන්ධව ආදායම් පරිපාලක වාර්තා ගෙන ඉදිරි කටයුතු කිරිමට යෝජනා කරමි.**
<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>
**එම යෝජනාව ස්ථිර කරමි**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා ආර්.එල් සජානි විජේනායක මියගේ ඉල්ලීම අනුව වෙළදාමක් කරගැනිමට

ස්ථානයක්ලබාදීම සම්බන්ධව ආදායම් පරිපාලක වාර්තා ගෙන ඉදිරි කටයුතු කිරිමට මහා සභා අනුමැතිය ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

**2022.06.10** දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක **05-23** උද්‍යතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

එස්. එච්.ආර්.වීරක්කොඩි,
ලේකම්,
ප්‍රාදේශිය සභාව,
කුරුවිට.

**2022.06.10** දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක **05-24** උද්‍යතය

**05-24.**අනතුරුදායක ගස් ඉවත්කර ගැනීම සම්බන්ධ යෝජනාව

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහජන පුස්ථකාලය අසල පවතින කොස් ගසෙන් පුස්ථකාලයට අනතුරුවන බවට විෂය නිලධාරි විසින් වාර්තාවක් ඉදිරිපත්කර ඇත.කොස්ගසේ අතුකැපීමටත් පොල්ගස් 2න් වන අනතුර ඉවත්කිරිමට එම ගස්කැපීමටත් අදාලව වාර්තා ඉදිරිපත්කර ඇත.ඒ අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහජන පුස්ථකාලය අසල පවතින කොස් ගසෙන් හා පොල් ගස් දෙකෙන් වන අනතුර ඉවත්කිරිමට කාර්මික නිලධාරි වාර්තා අනුව කටයුතු කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-
එම යෝජනාව ස්පීර කරමි

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහජන පුස්ථකාලය අසල පවතින කොස් ගසෙන් හා පොල් ගස් දෙකෙන් වන අනතුර ඉවත්කිරිමට කාර්මික නිලධාරි වාර්තා අනුව කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

**2022.06.10** දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක **05-24** උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

එස්. එච්.ආර්.වීරක්කොඩි,
ලේකම්,
ප්‍රාදේශිය සභාව,
කුරුවිට.

**<u>2022.06.10 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-25 උද්‍ධෘතයේ</u>**

**05-25.**කුරුවිට පොදු වෙළඳපල අංක **6** කඩකාමරය සම්බන්ධව.
<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

පුස්සැල්ල පරකඩුව එච්.ඒ.චි.ඒ නවරත්න මහතා විසින් ඉල්ලිමක් ඉදිරිපත් කර ඇති අතර අදාල ඉල්ලීම සභාගත කරමි. ඒ අනුව කුරුවිට පොදු වෙළඳපල අංක **6** කඩකාමරය මෙතුමාගේ පියා විසින් ටෙන්ඩර් ලබාගෙන මාසික් කුලී ගෙවාගෙන පැමින ඇති අතර පසුව එම කඩ සභාවට බදුගෙන නොමැති බැවින් කුරුවිට වෙළඳ සංගමයට බදු ගන්නා ලෙස දැන්වූබවත් එම වෙඳසංගමය දුම්රිය දෙපාර්තමේන්තුවෙන් බදු ඉල්ලූනමුත් එම කටයුත්ත සිදු නොවූ බවත් සභාවටද බදු නොගෙවූ බවත් පියාද මරනයට පත්වූබවත් දන්වා ඇත.ඉන්පසු සබාව අංක **6** කඩ කාමරය වෙනුවට අළුත් කඩයක් ලබාගැනීමට ඉදිරිපත්වන ලෙස දන්වා ඇත.ඒ අනුව මෙම

මහතා ඉදිරිපත්වුවද හිඟ කඩ මුදල් පොලිසමග ලක්ෂ ගානක් ගෙවිමට දැන්වුබවත් ප්‍රයෝජනයක් නොගත් කඩයක් වෙනුවෙන් එසේ මුදල් ගෙවිය නොහැකි බවත් දන්වා ඒ සම්බන්ධව මහඇමතිතුමා සමග කල සාකච්චාවේදී කඩ වලින් කඩ හිමියන් ඉවත් නොකරන ලෙස දැන්වූ අතර අළුතෙන් ගොඩනැගිල්ලක කඩ කාමර ලබාදෙන ලෙස හා ඒ සඳහා රු. ලක්ෂයක මුදලක් සභාවේ තැන්පත් කරන ලෙසත් හිඟ කඩ කුලී අමතර මුදලක් තොරව වර්ෂ තුනකින් වාරික 12 ගෙවන ලෙසත් දන්වා ඇත.ලක්ෂයක මුදලක් සභාවට ගෙවූවද කඩ නොලැබුන බවත් එසේ තිබියදී හිඟ කඩ මුදල් නොගෙවීම නිසා 2013 වසරේදි කඩ සීල් කල බවද දිසා අධිකරනයේ නඩුවක්ද පවරා ඇති බවත් කඩේ තිබූ භාන්ඩද අස්ථාන ගතවී ඇති අතර නඩුව ඉල්ලා අස්කරගන්නා ලෙසත් සිදුවූ අලාභය ගෙවන ලෙසද රු.100000.00 හෝ කඩයක් දෙන ලෙසද ඉල්ලා ඇත.මෙම ඉල්ලීම් සම්බන්ධ තීරනයක් ගැනීම සඳහා යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-</u>

මේ සම්බන්ධයෙන් කලින් තීරනයක් ගත්තා.එසේම නඩුවක් පවතිනවා.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

උසාවියේ නඩුවක් පවති.නඩු තීන්දුව අනුව ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව හා පුස්සැල්ල පරකඩුව එච්.ඒ.වි.ඒ නවරත්න මහතා විසින් සිදුකර ඇති කඩ ඉල්ලිම හා සහන පිලිබඳව උසාවියේ පවතින නඩුව තින්දුව අනුව ඉදිරි කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx

2022.06.10 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-25 උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

එස්. එච්.ආර්.වීරක්කොඩි,
ලේකම්,
ප්‍රාදේශිය සභාව,
කුරුවිට.

05-26 <u>. බොරලැස්ස වත්ත ඉඩම කොටසක් සභාවට පවරා ගැනීම</u>

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>

කුරුවිට ප්‍රාදේශීය සභා කිරිඇල්ල උප කාර්යාලය ඉඩම හා ලේකම් කාර්යාලය ඉඩම් නාය යන අවදානම සහිත බැවින් ඒ සඳහා ඉඩංගොඩ නගරයට ආසන්න බොරලැස්ස වත්ත ඉඩම කොටසක් සඳහා සැලැස්ම ක් කාර්මික නිලධාරි විසින් ඉදිරිපත්කර ඇත.මේ සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂන ආයතනයෙන් නාය යාම පිලිබඳව වාර්තාවක් ලබාගත් පසු පවරාගැනිමට කටයුතු ආරම්භ කිරිම සුදුසු බවට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>**
**එම යෝජනාව ස්ථිර කරමි**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව** කුරුවිට ප්‍රාදේශීය සභා කිරිඇල්ල උප කාර්යාලය ඉඩම හා ලේකම් කාර්යාලය ඉඩම් නාය යන අවදානම සහිත බැවින් ඒ සඳහා ඉඩංගොඩ නගරයට ආසන්න බොරලැස්ස වත්ත ඉඩම කොටසක් ජාතික ගොඩනැගිලි පර්යේෂන ආයතනයෙන් නාය යාම පිලිබඳව වාර්තාවක් ලබාගත් පසු පවරාගැනිමට කටයුතු ආරම්භ කිරිම සුදුසු බවට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

## <u>06.කාරක සභාවල වාර්තා</u>

06-01 මුදල් කමිටු වාර්තාව(2022.06.01)

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>**

22.06.01 වන දින මුදල් කමිටු වාර්තාව සඳහා සංශෝධනයන්ට යටත්ව සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය :-</u>**

22.06.01 දින මුදල් කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීම සුදුසු බවට යෝජනා ස්තිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා</u>**

අංක 78 පිච්චමල්ලන්ද මාර්ගය ජලයෙන් යටවිම හියුම්පයිප්ප යෙදිම සම්බන්ධව රු.39500.00 ගෙවිම් කර ඇත.එම ඉලක්කම් එකතුව සම්බන්ධව ගැටළු පවති.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>**

වව්චර්පත් පරීක්ෂා කල අතර මෙය මුද්‍රන දෝෂයකි.

1 1/2 අඩි අට හියුම්පයිප්ප කෑලි 2 x 13000.00 =රු.26000.00

1 1/2 අඩි 4 හියුම්පයිප්ප කෑලි2 x 6750.00 =රු.13500.00

මුළු මුදල රු.39500.00 ලෙස සංශෝධනය විය යුතුයි.එය සංශෝධනයක් ලෙස ඇතුලත් කරන්න.මෙය දිගුකාලීනව ගැටළුවක්ව තිබුනා.පාර මැද්ද වතුරරැදිලා යන්න බෑ.හියුම්පයිප්ප දාලා හැදුවා.අංක 80,84,සාකච්ඡාවට බඳුන්වූ අතර ගැටළු නිරාකරනය කරන ලදී.

ඉන්ධන පිරිමැසීම හා ලීටරයකින් නියමිත දුර දුවනවාද යන්න පිලිබඳව සැලකිලිමත්විය යුතුබව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා විසින් සාකච්ඡා කරනලදී.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx 22.06.01 වන දින මුදල් කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-02 කාර්මික කමිටු වාර්තාව (2022.05.18 )

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

2022.05.18 දින දින කාර්මික කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** 2022.05.18 දින **කාර්මික කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-03 කුඩානගර ජලසම්පාදනක්‍රමයේ විධායක කමිටු රැස්වීම් වාර්තාව.(22.06.15 )

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මහා සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-**

**අනවශ්‍ය වියදම් දරන්න එපා.**

## 07 ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ

07-01 -2022.අප්‍රියෙල් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

2022.අප්‍රියෙල් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**xxxxxxxxxxxx2022.අප්‍රියෙල් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ආදායම් ඇස්තමේන්තුව,ඒකාබද්ධ වැය සාරාංශය, වියදම් ඇස්තමේන්තුව, ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

## 07-03 2022. මැයි මස ගෙවීම් වාර්තාව

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>**
2022. මැයි මස ගෙවීම් වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**<u>ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා :-</u>**
2022. මැයි මස ගෙවීම් වාර්තාව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා :-</u>**
එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>**
නීතිඥ මහතා ගෙවීම් වැඩිකර ඉල්ලලා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් ජයරත්න මහතා :-</u>**

මේ නඩු සම්බන්ධ ඒවායේ ප්‍රගතිය දෙන්න.නඩු සම්බන්ධ කටයුතු නොමැතිව සෑම මසකම ගෙවන්න බෑ.
පෙනී සිටිනවටත් එක්ක ගෙවන්නේ.උසාවි දෙකක.ගිවිසුම් සහිතයි.

**ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා :-**
**මෙතෙක් කල් සියළු දිමනා ගෙව්වා.සනත් මහතාට ,නන්දිපාල මහතාට,මේ වෙලාවේ බැරි උනත් බෑ කියලත් බෑ.හයිකෝට්නඩු තියෙනවා.නිලධාරීන්ට පෙනී සිටින්න බැරි නඩුත් තියෙනවා. සභාව කියනවා එකඟ නෑ කියලා.මේක සදාචාර ගැටළුවක්. මේ අවස්ථාවේ මේ ඉල්ලීම.**
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx 2022 මැයි මස ගෙවීම් වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

08. වෙනත් කරුණු.

08-01
**<u>ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා :-</u>**
සිරිපාල උප සභාපතිතුමාගේ ඉල්ලීම ඉටු කරන්න.එම අදාල වාර්තා අනුව ඒ කඩය ලබාදෙන්න.
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ප්‍රේමා ගම්ලත් මිය-</u>**
එම කඩය ලබාදෙන්න.

08-02

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>

අද තේපැන් ගරු ධනවර්ධන මන්ත්‍රී තුමාගෙන්.ඔබතුමාට මේ සත්කාර්ය වෙනුවෙන් නැවතත් නිදුක් නීරෝගීභාවය ප්‍රාර්ථනා කර සිටිනවා.ඊලග මාසේ මගෙන් සංග්‍රහය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා</u>

ධනවර්ධන ගරු මන්ත්‍රිතුමා ශ්‍රේෂ්ඨ චරිතයක්. එතුමා නිරන්තර සේවාවන් සිදු කරනවා.අපිත් හැකි ලෙස කරන්නම්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා</u>

මෙතුමා දිගුකලකසිටම සභාවේ රැඳී සිටියා.සේවක ඇඳුම් ,බුදුමැදුර, පොත් ලබාදීම් අපිටත් වෙනම විහාරය හදන්න උදව් කරනවා.එතුමාගේ සේවය වෙනුවෙන් මම පුද්ගලිකවම ගරු කරනවා.අපි සභාවේ තේබිලත් අඩු කලා.මේ වෙලාවේ සභාවත් ඕනි නෑ. ඒකත් විශාල වියදමක්.මධ්‍යම, පලාත් සභාත් ආධාර නෑ.ඒ නිසා සභාව විසුරවන්න කියමු.මේ වියදම්වලින් වෙන දෙයක් රටට කරන්න පුළුවන්. විසුරවනවානම් හොඳයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා</u>

අදහස වැදගත්. මොකද මේ වෙලාවේ අපි ආදර්ශ විය යුතුයි.අපිට ගෙවන ගෙවීම් ,අපිට දුරකතන බිලක් දැන් යන්නේ නෑ.පැට්‍රල් ඇත්තේත් නෑ.

**සභාවේ ගෝෂා.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>

**මේක හදිසි යෝජනා තුල කරන්න.1/3ක් අත්සන් කරන්නත් ඕනි.**
**මේ වෙලාවේ කැපකිරිමක් කරන්න පුළුවන්නම් හොඳයි.තම තමන් දීමනා ඕනි නෑ කියලා ලිපියක් දුන්නාම හරි.ලේකම්තුමියට.නමුත් හැමෝටම එහෙම බෑ.**

- **ස්තූතිය.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>

අද දින මහා සභාව සදහා සහභාගිවී සභය ලබාදුන් සියළු දෙනා හට ස්තූතිය පල කරමි.
සභාවේ කටයුතු ප.ව. 4.05 ට අවසන් කරන ලදී.

ප්‍රේමරත්න මල්කැකුළ
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

පිටපත් : -
01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණු ගැන අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී - (දැ.ගැ.පි)

**02.**<u>යථා පරිදි කල් දී ඇති යෝජනා-</u>

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා</u>

**<u>යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන අනෙකුත් යෝජනා.</u>**

**03.**<u>කාරක සභාවල වාර්තා</u>

06-01 මුදල් කමිටු වාර්තාව(2022.06.01)
06-02 කාර්මික කමිටු වාර්තාව (2022.05.18)
06-03 කුඩානගර ජලසම්පාදනක්‍රමයේ විධායකකමිටු රැස්වීම් වාර්තාව.(2022.05.17)

**07** <u>ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>

-2022 අප්‍රේල් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය.